2025

කාර්ය සාධන වාර්තාව

சாதனைகள் அறிக்கை

Performance Report



සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

கலாசார அலுவல்கள் திணைக்களம்

Department of Cultural Affairs

8 වන මහල සෙත්සිරිපාය බත්තරමුල්ල 8ஆம் மாடி, செத்சிறிபாய, பத்தரமுல்ல. 8th floor,Sethsiripaya, Battaramulla

කාර්ය සාධන වාර්තාව 2025

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සහ දෙපාර්තමේන්තුව විසින්
2025 වර්ෂය තුළ සිදුකළ වැඩසටහන්, මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය සම්බන්ධයෙන් වන
මෙම සංක්ෂිප්ත සටහන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ
සංවර්ධන හා සැලසුම් අංශය විසින් සම්පාදනය කරන ලදි.

ප්‍රකාශනය
සංවර්ධන හා සැලසුම් අංශය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල සෙත්සිරිපාය
බත්තරමුල්ල

මාර්ගෝපදේශකත්වය
ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමා
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය

උපදේශකත්වය
ප්‍රින්ස් සේනාධීර මැතිතුමා
ලේකම්
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අනුශාසකත්වය හා අධීක්ෂණය
කේ.එස් දිල්හානි මහත්මිය
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මෙහෙයවීම
කේ.එම්. පේ.කේ. රත්නායක මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - සංවර්ධන හා සැලසුම්

සංජය වේහැල්ල මහතා
අංශ ප්‍රධානී - සංවර්ධන හා සැලසුම්

සංස්කරණය, තොරතුරු සම්බන්ධීකරණය, සෝදුපත් කියවීම හා
පරිගණක අක්ෂර සංයෝජනය
ප්‍රසන්ති පෙරේරා (කළමණාකරණ සේවා නිලධාරී)

විශේෂ ස්තුතිය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සියලුම සහකාර අධ්‍යක්ෂවරුන් ගණකාධිකාරී පරිපාලන නිලධාරී ඇතුලු කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සහ අනුබද්ධ ආයතනයන්හි ආයතන ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලයන්ට

පිටකවර නිර්මාණය, පරිගණක ග්‍රාෆික නිර්මාණකරණය
අයි සමිත පෙරේරා (සංස්කෘතික සංවර්ධන සහකාර)

භාෂා පරිවර්තනය
එස්. ශිවනේෂන් මහතා (දමිල භාෂා පරිවර්තනය)

මුද්‍රණය
සංවර්ධන හා සැලසුම් අංශය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල සෙත්සිරිපාය
බත්තරමුල්ල

2025 සංස්කෘතික විෂය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය



2025 වසරේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අදාළ කාර්ය සාධනය මෙහි දක්වා ඇත. 2025 වසර මුල් කර ගනිමින් නව ක්‍රියාකාරකම් වැඩසටහන් ගණනාවක් ආරම්භ කිරීමට හැකියාව ලැබුණු අතර පැවති යල් පැන ගිය ඇතැම් චක්‍රලේඛ ආදිය නවතාවයෙන් ඉදිරිපත් කරමින් දෙපාරතමේන්තු කාර්ය භාරය වඩා සපලදායි හා විනිවිධ භාවයෙන් යුත් වැඩසටහන් ලෙස දියත් කිරීමට හැකියාව ලැබීම මෙම වසරේදී අප ලද ජයග්‍රහණයකි.

දෙපාර්තමේන්තු කාර්ය භාරයේ සුවිශේෂ අවධානයක් යොමු කරන කලායතන සේවාව සහ කලා සංගම් වෙනුවෙන් නව චක්‍රලේඛයක් නිකුත් කරමින් එම සේවාවන්ගේ ද තිරසාර භාවයට පියවර ගැණින.

2025 වසරේ සිදුකළ නව්‍ය වැසටහන් අතර 'අතුරු මිතුරු' ළමා කතන්දර කවි හා ගීත ගායනා වැඩසටහන, අස්පර්ශනීය කලා උරුම සංරක්ෂණය සඳහා කළ වීඩියෝ පටිගත කිරීම්, දෙකක් සිදු කළ අතර සාම්ප්‍රදායික බෙර පොහොය හේවිසි වාදනය සහ සබරගමු සාම්ප්‍රදායික පහන් මඩු ශාන්තිකර්මය එම වීඩියෝ පටිගත කිරීමට හා සංරක්ෂණයට අයත් විය. ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය ලැයිස්තු සම්පාදනය සඳහා නිසි ක්‍රමවේදයක් මේ තාක් සිදු නොවුණු බැවින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඒ සඳහා මැදිහත් විය. ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සහ යුනෙස්කෝ කොමිෂන් සභාවේ දායකත්වය මත කුරුණෑගල දිස්ත්‍රික්කයේ දී සහ උතුරු පළාතේ සිදුකළ යුනෙස්කෝ පුහුණු වැඩසටහන්, මෙම වසරේ සුවිශේෂ වටිනාකමක් ගනී

සෑම දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකම ක්‍රියාත්මක වූ දොළොස් මහේ පහන වැඩසටහන් මාලාව සඳහා ප්‍රතිපාදන ලබා දුන් අතර දොළොස් මහේ පහණ වැඩසටහනට ආදේශකයක් වශයෙන් 2026 වසරේ සිට වත්සර පියවර නම් ප්‍රාදේශිය අවශ්‍යතා අනුව සංවිධානය වන ප්‍රාදේශිය සංස්කෘතික වැඩසටහන් මාලාව සංවිධානය කිරීමට හැකියාව ලැබිණ.

2025 වසරේ පවත්වන්නට නියමිතව පැවති උත්සව ගණනාවක් 2026 වසරේ මුල් මාස දෙක තුළ සිදුකිරීමට පියවර ගැනීමට සිදුවිය. වසර අවසාන භාගයේ සිදුවූ දිට්වා කුණාටු තත්ත්වය හා එම ව්‍යසනය හේතුවෙන් ඇතිවූ සංචරණ, මුල්‍ය ආදී ගැටලු මේ සඳහා බලපෑවේය. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අනුබද්ධ ආයතන මගින් ද සුවිශේෂ වැඩසටහන් රැසක් දියත් කරන්නට යෙදුණු අතර වඩාත් ඵලදායී කාර්යයන් දියත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

වසර 04ක කාලයක් සිදුකළ නොහැකි වූ රූපවාහිනී රාජ්‍ය සම්මාන උලෙළ ද 2025 වසරේ සිදුකරමින් පසුගිය සිව් වසර සඳහා නියමිත ඇගයීම් කළ හැකි වීම අප ලද ජයග්‍රහණයකි. ඒ සමගම ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ අනුමණ්ඩල හරහා වැඩමුලු සම්මන්ත්‍රණ සංකථන ආදිය සිදුකිරීමටත් ජනතා ආකර්ෂණය බහුල සුභාවිත ගී වියමන නම් 60-70 දශකයේ ගායක ගායිකා ප්‍රසංගයට නවීකරණය කරමින් දෙමළ බසින් හා දෙමළ කලා නිර්මාණ ජනගතවන පරිදි නව ප්‍රසංගයක් සංවිධානය කිරීමට ලැබීම ජයග්‍රහණයක් කොට සැලකිය හැකිය.

මේ අයුරින් 2025 වසරේ පැවති ස්වභාවික විපත් ආපදා තත්වයන් ආදී අභියෝග හමුවේ පවත්නා ප්‍රතිපාදන තත්ත්වය මෙන්ම කාල කළමනාකරණය මනාව සිදුකර ගනිමින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙවර ට අදාළ කාර්යයන් රැසක් සාර්ථකව සිදු කළ හැකි විය.

කේ.එස්. දිල්හානි
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

2025 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ ආකාරය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.6 දෙපාර්තමේන්තු යටතේ පවතින ආයතන/අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති තොරතුරු

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම
විශේෂ, ජයග්‍රහන/අභියෝග හා ඉදිරි ඉලක්ක

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

1.1 **හැඳින්වීම**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

1956 වසරේ බලයට පත් වූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතානන්ගේ ජනතා රජය යටතේ 1956 සැප්තැම්බර් මස 26 දිනැති අංක 10975 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය.

ශ්‍රී ලාංකේය අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය, සහ ව්‍යාප්තිකරණය සඳහා වැඩසටහන් සම්පාදනය කිරීමෙන් සහ ක්‍රියාත්මක කිරීමෙන් සංස්කෘතික ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා මෙම දෙපාර්තමේන්තුව සුවිශාල මෙහෙවරක් ඉටුකරනු ලබයි.

දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මහාවංස සම්පාදන කාර්යාලය, සිංහල ශබ්දකෝෂ කාර්යාලය, සිංහල විශ්වකෝෂ කාර්යාලය, ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල, උතුරු දකුණු මිතුරු සෙවණ සංස්කෘතික කේන්ද්‍රය, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල, වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය, කුණ්ඩසාලේ ජාතික කලා නිකේතනය ආදිය ද සංස්කෘතික ප්‍රබෝධයක් ඇතිකරලීම සඳහා දෙපාර්තමේන්තු කාර්යයන්ට උර දී ක්‍රියා කරයි.

ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික නර්තන කලාවේ උන්නතියට විසල් මෙහෙවරක යෙදෙන රාජ්‍ය නර්තන කණ්ඩායම සහ රාජ්‍ය සංගීත කණ්ඩායම ද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලැබේ.

කලාකරු සබඳතා, සාහිත්‍ය හා ප්‍රකාශන, සංස්කෘතික ප්‍රවර්ධන, සංවර්ධන හා සැලසුම්, පාලන, ගිණුම් සහ ප්‍රසම්පාදන යනුවෙන් අංශ 07ක් යටතේ දෙපාර්තමේන්තු කටයුතු ක්‍රියාත්මක වන අතර සංස්කෘතික ප්‍රවර්ධන අංශය යටතේ උපදේශක මණ්ඩල 09 ක් මඟින් රාජ්‍ය උත්සව හා ජාතික සැමරුම් උළෙල සඳහා සඵලදායී දායකත්වයක් ලබාදේ.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉටුකිරීමට සහ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සඳහා සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් සඳහා සංස්කෘතික නිලධාරිවරයෙක් හෝ සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරිවරයෙක් /සංවර්ධන නිලධාරිවරයෙක් බැගින් අනුයුක්ත කොට ඇති අතර එම නිලධාරීන් හරහා දෙපාර්තමේන්තු කාර්යභාර්ය ග්‍රාමීය ජනතාව දක්වා ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත.

වාර්ෂික වැඩ සැලැස්මකට අනුව දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් මෙහෙයවීම සිදුකෙරෙන අතර දොළොස්මහේ පහන හා සාහිත්‍ය මහෝත්සව මේ අතර ප්‍රධාන තැනක් ගනී. තත් වැඩසටහන්හි ප්‍රගතිය දිස්ත්‍රික් නිලධාරීන් හරහා කාර්තු වශයෙන් සංස්කෘතික දෙපාර්තමේන්තුවට ලබාගැනීම සිදුකෙරෙන අතර සඵලදායී නියාමනයක් හා අධීක්ෂණයක් සඳහා තත් කාර්යයන් සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂවරුන් ක්‍රියා කරයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1. 2. 1 දැක්ම

නිවුණු හැදුණු පිරුණු සොඳුරු මිනිසුන් සපිරි පින්බර දේශයක් එක්ව ගොඩනැගීම

1.2.2 මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවයෙන් යුත් අස්පර්ෂීය සංස්කෘතිය සංරක්ෂණය ප්‍රවර්ධනය ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

1.2.3 අරමුණු

ශ්‍රී ලාංකේය සංස්කෘතික පුරුෂාර්ථ හා ආචාර ධර්ම අනාගත පරපුරට දායාද කිරීම සඳහා අස්පර්ෂ උරුමයන් සංරක්ෂණය

සාම්ප්‍රදායික සංස්කෘතිකාංග හා අස්පර්ෂ උරුමයන් සංරක්ෂණය කරමින් දේශීය අනන්‍යතාව ප්‍රකටනය කිරීම උදෙසා අස්පර්ෂ උරුමයන් ප්‍රවර්ධනය

සාරධර්ම සම්පන්න සමාජයක් ගොඩනැගීම උදෙසා අස්පර්ෂ උරුමයන් ව්‍යාප්තිකරණය

උසස් රසවින්දනයක් උදෙසා නිර්මාණ ප්‍රමිතිගත කිරීම

කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම

සියලුම කලාංගයන් තුළ තිබෙන ශාස්ත්‍රානුකූල බව සුරැකීම



1.3 ප්‍රධාන කාර්යයන්

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමුඛතා පරාසයන් Trust Areas 6ක් හඳුනා ගනිමින් ඒ අනුව දියත් කෙරේ. මේ අතර

කලාකරුවන්

කලා නිර්මාණ

කලා ආයතන

කලා සංගම්

නිලධාරීන්

මහජනතාව

යන අංශ විස්තර කළ හැකිය. මේ යටතේ ඉලක්ක ගත කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කෙරෙන අතර කලාකරුවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම කලාකරුවන්ට සම අවස්ථා ලබාදීම වෙනුවෙන් උපාය මාර්ග දියත් කෙරෙන අතර කලාකරුවන්ගේ දැනුම කුසලතා ආකල්ප සංවර්ධනය කිරීම හා උසස් ජීවන මට්ටමක් පවත්වාගෙන යාමට පහසුකරණය සඳහා වූ කාර්යයන් දියත් කෙරේ.

කලා නිර්මාණ යටතේ උසස් රසවින්දනයක් ඇතිකිරීම සඳහා කලා නිර්මාණයන්හි ප්‍රමිතිය ඉහළ නැංවීම හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ජනගත කිරීම හා ප්‍රදර්ශන හා සංදර්ශන සඳහා වූ කාර්යයන් දියත් කෙරේ.


කලා ආයතන සම්බන්ධයෙන් ප්‍රශස්ත සේවාවක් හා දීප ව්‍යාප්ත සේවාවක් ඇතිකරනු වස් ප්‍රශස්ත සේවාව, ඇගයීම හා ප්‍රමිතිගත කිරීම, ආදිය උදෙසා යහපාලනය අධීක්ෂණය, ඇගයීම, නියාමනය (තක්සේරු කිරීම) යන කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කෙරෙන අතර ඒ සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති දියත් කෙරේ.

කලා සංගම් යටතේ ප්‍රශස්ත සේවාවක් හා දීප ව්‍යාප්ත සේවාවක් ඇතිකරනු වස් ප්‍රශස්ත සේවාව, ඇගයීම හා ප්‍රමිතිගත කිරීම, ආදිය උදෙසා යහපාලනය අධීක්ෂණය, ඇගයීම, නියාමනය (තක්සේරු කිරීම) යන කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කෙරෙන අතර ඒ සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති දියත් කෙරේ.

නිලධාරීන් වෙනුවෙන් සිදුකෙරෙන හා නිලධාරීන් යොදවා සිදුකෙරෙන කාර්යයන් සඳහා වගකීමෙන් හා වගවීමෙන් ඵලදායීව කටයුතු කරන රාජ්‍ය සේවකයෙකු බිහිකිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම සිදුවන අතර දැනුම කුසලතා ආකල්ප වර්ධනය, යහපාලනය සහ අභිප්‍රේරණය යන උපාය මාර්ගයන්ට අදාල කාර්යයන් දියත් කෙරේ.

මහජනතාව උදෙසා දක්වන ආකල්පය හා මෙහෙවර යටතේ ශික්ෂාකාමී ජන සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය පසුබිම සැකසීම සහ රසවින්දනයක් ඇති කිරීමට කටයුතු කිරීම සිදුකෙරෙන අතර මේ සඳහා දැනුම කුසලතා ආකල්ප වර්ධනය, යහපාලනය, නිර්මාණ ප්‍රමිතිගත කිරීම සහ ඇගයීම යන උපාය මාර්ගයන්ට අදාල කාර්යයන් දියත් කෙරේ.

1.4 සංවිධාන සටහන


DIRECTOR
DEPUTY/ASST. DIRECTOR (ADMIN)
DEPUTY/ASST. DIRECTOR (ARTISTS RELATIONS)
DEPUTY/ASST. DIRECTOR (PLANNING & DEVELOPMENT)
DEPUTY/ASST. DIRECTOR (CULTURE & ARTS PROMOTION)
DEPUTY/ASST. DIRECTOR (LITERATURE & PUBLICATIONS)
ACCOUNTANT
INTERNAL AUDITOR
ADMINISTRATIVE OFFICER
TECHNICAL OFFICER
TRANSLATOR
HEAD OF THE BRANCH
OFFICER IN - CHARGE
DEPUTY AUTHOR
ASSISTANT AUTHOR
AUTHOR
OFFICE ASSISTANT
MANAGEMENT SERVICE OFFICER
DEVELOPMENT OFFICER/CULTURAL DEV. ASST.
DATA ENTRY OPERATOR
LIBRARIAN
ART EDITOR
EDITORIAL ASST.
PROOF READER
STORE KEEPER
MANAGER
DANCER
GROUP CARETAKER
MUSICIAN
ASSISTANT CURATOR
WARDEN
GARDEN KEEPER
WARDEN AIDE
AUDIO VISUAL TECHNICIAN
AUDIO CONTROLLER
CONTROLLER AIDE
A/C OPERATOR
STAGE ELECTRICIAN AIDE
STILL PHOTOGRAPHER
VIDEO CAMERA OPERATOR
CAMERAMAN
AUDIO / VISUAL EDITOR
AUDIO VISUAL EDITOR ASST.
LORRY HELPER
DRIVER

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන හා ප්‍රධාන අංශ

1.5.1 ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල

ජාතික වටිනාකමකින් යුතු ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා රඟහල පරිශ්‍රය කලාකරුවන් සඳහා කදිම තෝතැන්නකි. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල වත්මන් ඉදිකිරීම් හා නවීකරණ කාර්යයන්හි යොදවා තිබෙන බැවින් මේවන විට බැහැර පාර්ශ්වයන් සඳහා දැනට කුලි පදනම මත ලබාදෙනු නොලැබේ

1.5.2 මහාවංස සම්පාදන කාර්යාලය

ශ්‍රී ලාංකේය ප්‍රෞඩ ඉතිහාස ග්‍රන්ථය වන මහාවංසය සම්පාදනය කිරීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ සිදුවේ. 1935 දක්වා ලියැවී ඇති මහාවංස කාණ්ඩ 03ට අමතරව 1935 සිට 1956 දක්වා රාජ්‍ය පරිපාලන යුගය අළලා මහාවංසයේ සිව් වෙනි කලාපය සකස් කර ඇති අතර, 1956 සිට 1978 දක්වා මහාවංසය ලිවීම 2008 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. එම පරිපාලන යුග අළලා සැකසෙන මහාවංසය සිංහල හා පාලි භාෂාවෙන් සකස් කෙරෙන අතර මහාවංස සම්පාදන කාර්යාලය මඟින් මෙම කාර්යභාරය ඉටු කරයි.

1.5.3 සිංහල ශබ්දකෝෂ කාර්යාලය

සිංහල භාෂාව සඳහා අකාරාදි ක්‍රමයේ ශබ්දකෝෂයක් සම්පාදනය කිරීමට පුරෝගාමී උගතුන් සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂයක අවශ්‍යතාව හඳුනාගෙන 1972 දී රාජ්‍ය අනුග්‍රහය යටතේ සිංහල ශබ්දකෝෂ කාර්යාලය ආරම්භ කරන ලදී. පසු කාලයේ දී වෙනස්වීම්වලට භාජනය වූ ව්‍යවස්ථා වෙනස්කම්, රාජ්‍ය ප්‍රතිපත්ති සහ විධායකය විසින් ගනු ලබන විවිධ තීන්දු තීරණවලට අනුගතව කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ක්‍රියාත්මක කරමින් වර්තමානය වන විට ශබ්දකෝෂ කාර්යාලයෙන් දියත් කෙරෙන ව්‍යාපෘති සංඛ්‍යාව 07ක් දක්වා වර්ධනය වී ඇත.

1.5.4 විශ්වකෝෂ කාර්යාලය

විශ්ව ඥානය සිංහල භාෂාවෙන් සැපයීමේ අවශ්‍යතාව සපුරාලනු වස් විවිධ මාතෘකා යටතේ අකාරාදි පිළිවෙළට ග්‍රන්ථගත කොට කාණ්ඩ මඟින් ප්‍රකාශයට පත් කිරීම මෙමඟින් සිදු කෙරෙයි. මේ වන විට සිංහල විශ්වකෝශයේ කාණ්ඩ 13ක් නිකුත් කර ඇත. මෙහි ඉලක්කගත කාණ්ඩ ප්‍රමාණය 20කි. 1 සිට 12 දක්වා කාණ්ඩ වර්ෂ අනුව 1963, 1965, 1967, 1970, 1974, 1978, 1988, 1991, 1994, 1998, 2001, 2006, 2010, 2014 පරිදි නිකුත් කර ඇත.

1.5.5 එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා නාට්‍ය කලාව වෙනුවන් කළ අනුපමේය සේවය අගය කිරීම සහ විධිමත් පරිදි නාට්‍ය කලාව අධ්‍යයනය කිරීමේ අඩුව පිරිමසාලීම සඳහා නාට්‍ය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කර ඇත. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ විෂයපථය අනුව නාට්‍ය නිර්මාණකරණයේ දී, පුහුණුවේදී හා අධ්‍යයනයේ දී වන අවශ්‍යතා සපුරාලීම සඳහා මෙන්ම සිංහල හා දෙමළ ජාතික අන්තර්සහජීවනයේ සංස්කෘතිකමය සබැඳියාව සහ නිර්මාණකරණය වර්ධනය කිරීම තුළින් ජාතික සමගිය ගොඩනැගීම පදනම් කරගනිමින් මෙම ව්‍යාපෘතිය ආරම්භ විය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොස්වත්තේ පිහිටි පැරණි සිරි සුමේධ පාසල පිහිටි පර්චස් 31.1ක බිම් කොටස සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පවරාගෙන එහි පැරණි පාසල් ගොඩනැගිල්ල නාට්‍ය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස නවීකරණය කිරීම සිදු

කරනු ලැබීය. පූර්ණ අලුත්වැඩියාවකින් පසු 2015 මාර්තු 11 වන දින උත්සවාකාරයෙන් විවෘත කිරීම සිදු කරන ලදි.

මේ වන විට මෙහි රාජ්‍ය නර්තන සහ සංගීත කණ්ඩායම්වල පුහුණුවීම් කටයුතු සිදු කෙරෙන අතර, මීට අමතරව නාට්‍ය පුහුණුවීම් කටයුතු සඳහා බාහිර පාර්ශ්වයන් වෙත සහන මිලක් මත ලබාදෙනු ලැබේ.

1.5.6 වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය හා සංස්කෘතික කේන්ද්‍රය

ජාතික සටනේ පුරෝගාමියෙකු වූ වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමාගේ මහ හුණුපිටිය, කටාන පිහිටි නිවස හා හෙක්ටෙයාර් 0.2118ක් වූ ඉඩම 2011.06.24 දින සිට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පවරා දෙන ලදි.

මෙම ස්ථානය සංස්කෘතික මධ්‍යස්ථානයක් වශයෙන් සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනයට යොදවා ගනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලාංකීය සංස්කෘතිකාංග හා වලිසිංහ හරිස්චන්ද්‍රතුමා පරිහරණය කළ නිවාස උපකරණ පිළිබඳ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් දැනුවත් කිරීමේ අරමුණින් ජාතික හා ජාත්‍යන්තර වැදගත් කෞතුකාගාරයක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඇත.

සැප්තැම්බර් 13 ට යෙදෙන වලිසිංහ හරිස්චන්ද්‍ර ගුණානුස්මරණ උළෙල මූලික කොටගත් වැඩසටහන් මෙහිදී ක්‍රියාත්මක කරනු ලබන අතර දෙනිකව විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති මඟින් ප්‍රදේශයේ සංස්කෘතික හා කලා පුනරුදයට අවශ්‍ය පසුබිම මෙහිදී ගොඩනැගීමට කටයුතු කර ඇත.

1.5.7 ජාතික කලා නිකේතනය - මහනුවර කුණ්ඩසාලේ

කලා නිර්මාණකරණය, නව අත්හදාබැලීම් හා පර්යේෂණකරණය, දේශීය හා විදේශීය කලා කෘති පරිශීලනය හා කලාව පිළිබඳ අධ්‍යයනය හා අධ්‍යාපනය ලබාදීම සඳහාත්, ප්‍රාසාංගික හා හස්තමය නව කලාවන් පිළිබඳ අධ්‍යයනය හා අධ්‍යාපනය ලබාදීම සඳහාත්, ප්‍රාසාංගික හා හස්තමය නව නිර්මාණ බිහිකිරීමත් එම කලා කෘති ප්‍රදර්ශනය හා අලෙවිය තුළින් ජාතික හා අන්තර්ජාතික ප්‍රචාරණයක් ලබාගැනීම සඳහාත් අවශ්‍ය භෞතික තාක්ෂණික හා බුද්ධිමය සම්පත්වලින් පරිපූර්ණ වූ සෞන්දර්ය කේන්ද්‍රයක් බිහිකිරීමත් අරමුණු කරගෙන 2008 ජනවාරි මාසයේ කුණ්ඩසාලේ ජාතික කලා නිකේතනයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදි.

මෙහි මුළු ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 465 කි. පළමු අදියර යටතේ එළිමහන් රංග ශාලාව, වැසිකිළි කැසිකිළි පද්ධතිය මාර්ග පිළිසකර කිරීම, රැඳවුම් බැම්ම හා කාණු පද්ධතිය ඉදිකිරීම සිදුකළ අතර දෙවන අදියර යටතේ කලා ශිල්පී නිවාඩු නිකේතනය, ප්‍රභූ නිවාඩුනිකේතය, ජල ටැංකිය සහ කුළුණ, එළිමහන් රඟහල සහ නේපත්‍යාගාරය ඉදිකිරීම, පිරිමි සහ කාන්තා නේවාසිකාගාර, පුහුණු ශාලා අංක 1 සහ 2 ඉදිකිරීම සහ භූමි සැලසුම සැකසීම සිදුවිය

මෙය 2018 වසරේ උත්කර්ෂවත් අයුරින් විවෘත කිරීමට කටයුතු කෙරිණි.

1.5.8 උතුරු දකුණු මිතුරු සෙවණ

උතුරේ සහ දකුණේ ජීවත් වන සිංහල, දෙමළ කලාකරුවන් ඒකරාශී කරමින් නිර්මාණ බිහිකිරීමේ අවස්ථාවක් ලබාදීම සහ ජාතික සමගිය කලාකරුවන් හරහා ගොඩනැංවීම අරමුණු කරගනිමින් උතුරු දකුණු මිතුරු සෙවණ ස්ථාපනය කරන ලදි.

2012 දැයට කිරුළ වෙනුවෙන් වෙන් වූ මුදල භාවිතා කරමින් අනුරාධපුර මිහින්තලේ නගරයේ මෙම කලා නිර්මාණ අසපුව ඉදිකරනු ලැබිය. මෙහි ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මි.10කි. මේ ව්‍යාපෘතියේ එළිමහන් රංග ශාලාව, ප්‍රධාන ශාලාව සහ නේවාසිකාගාරය ඇතුළත් ය.

1.5.9 පොත් ගබඩාව සහ පොත් අලෙවිසැල

දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරනු ලබන සියලුම පොත් බෙදා හැරීම සිදු කරන තෙක් කොළඹ පිහිටා ඇති දෙපාර්තමේන්තු ගබඩාවේ ගබඩා කර තබනු ලැබේ. පොත් අලෙවිසැල ක්‍රියාත්මක වන්නේ සිංහල ශබ්දකෝෂ කාර්යාල පරිශ්‍රයේ ය.

මෙහිදී සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් අලෙවි කරනු ලබන සියලුම වර්ගවල පොත් ඉතා සහන මිල ගණන් යටතේ මිල දී ගැනීමට හැකියාව ඇත.

1.5.12 රාජ්‍ය නර්තන කණ්ඩායම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින රාජ්‍ය නර්තන කණ්ඩායම දිවයිනේ දක්ෂ ශිල්පීන් ශිල්පිනියන් සංචිතයකින් සැදුම් ලැබ ඇත. දෙස් විදෙස් ප්‍රසංග අවස්ථා ආවරණය කරමින් රාජ්‍ය අංශයේ කාර්යයන් සඳහා සිය ප්‍රසංග දායකත්වය ලබාදෙන රාජ්‍ය නර්තන කණ්ඩායම ශිල්පීන් හා ශිල්පිනියන් 29 දෙනෙකුගෙන් සමන්විත වේ.

1.5.13 රාජ්‍ය සංගීත කණ්ඩායම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින රාජ්‍ය සංගීත කණ්ඩායම ගායන හා වාදන ශිල්පීන් සහ ශිලිපිනියන් 42 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමකි. දෙස් විදෙස් ප්‍රසංග අවස්ථා ආවරණය කරමින් රාජ්‍ය අංශයේ කාර්යයන් සඳහා සිය ප්‍රසංග දායකත්වය ලබාදෙන රාජ්‍ය සංගීත කණ්ඩායම දිවයිනේ ප්‍රකට වාද්‍ය වෘන්දයකි.

1.5.14 දෙපාර්තමේන්තුවේ අංශ

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අංශ 07 ක් ක්‍රියාත්මක කරමින් කළමනාකරණය දියත් කෙරේ මේ අතර පාලන අංශය, කලාකරු සබඳතා අංශය, කලා ප්‍රවර්ධන අංශය, සාහිත්‍ය හා ප්‍රකාශන අංශය, ගිණුම් අංශය, සැලසුම් හා සංවර්ධන අංශය සහ ප්‍රසම්පාදන අංශය වේ. සහකාර අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකු හා අංශ ප්‍රධානීන් 07 දෙනෙකුගෙන් අධීක්ෂණය මෙහෙයවීම් සිදුකෙරෙන මෙම අංශයන් මගින් දෙපාර්තමේන්තු කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාවට නැංවේ.

1.6 දෙපාර්තමේන්තු අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති තොරතුරු (තිබේ නම්) නැත

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ, ජයග්‍රහණ/අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1 ප්‍රගතිය

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් කරන ලද කලාකරු සුබසාධන කාර්යයන්හි ප්‍රගතිය

2.1.1 - ජාතික කලාකරු හැඳුනුම්පත් නිකුත් කිරීම

නිකුත්කළ හැදුණුම්පත් සංඛ්‍යාව	වියදම රුපියල්
743	96,590.00

2.1.2 - වෛද්‍යාධාර ලබාදීම

වෛද්‍යාධාර සංඛ්‍යාව	වියදම රුපියල්
224	**6,785,000.00**

2.1.3 - අගහිඟ කලාකරු ආධාර

	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම රුපියල්
සිංහල මාධ්‍ය	**2633**	**26,330,000.00**
දෙමිල මාධ්‍ය	**278**	**2,780,000.00**
එකතුව	**2911**	**29,110,000.00**

2.1.4 - කලායතන ආධාර ලබාදීම

මෙම වර්ෂයේදී කලායතන ශ්‍රේණිගත කිරීම් නොකරන ලද අතර, 2022 ශ්‍රේණිගත කිරීම් සිදුකල ලේඛනයට අනුව 2025 වර්ෂය සඳහා සියළු කලායතන සඳහා සමානුපාතිකව කලායතන ආධාර ලබා දී ඇත.

සිංහල හා දෙමළ මාධ්‍ය කලායතන

කලායතන සංඛ්‍යාව	එක් කලායතනයක පිරිවැය	සමස්ත පිරිවැය
1268	**7,848.00**	**9,951,264.00**

2.1.5 - පෙරහැර ආධාර ලබාදීම

පෙරහැර ආධාර සංඛ්‍යාව	වියදම රුපියල්
22	**370,000.00**

2.1.6 - අවමංගල්‍යාධාර ලබාදීම

සංඛ්‍යාව	වියදම රුපියල්
100	**2,345,900.00**

2.1.7 - විවිධ උත්සව ආධාර ලබාදීම

සංඛ්‍යාව	වියදම රුපියල්
8	**185,000.00**

2.1.8 - ලියාපදිංචි වූ සංස්කෘතික සංගම් හා කලායතන සංඛ්‍යාව

සංස්කෘතික සංගම් හා කලායතන සඳහා නව සංගම් ව්‍යවස්ථා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී කලායතන සහ සංස්කෘතික සංගම් ක්‍රියාකාරීත්වය සහ තිරසාර භාවය මුලික කරගනිමින් නව චක්‍රලේඛය නිකුත් කරන්නට යෙදුණු අතර එබැවින් 2025 වර්ෂයට ලියාපදිංචි කර ඇත්තේ එක් සංගමයක් පමණි.

2.1.9 - කලාකරු සුවදම් වැඩසටහන (ජාතික මිටටම)

සංඛ්‍යාව	වියදම රුපියල්
08	**104,907.00**

2.1.10 - කලාකරු සුවදම් වැඩසටහන (ප්‍රාදේශීය මිටටම)

සංඛ්‍යාව	වියදම රුපියල්
341	**5,115,000.00**

2.1.11 - රාජ්‍ය සංගීත කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද උත්සව/ප්‍රසංග

දේශීය	විදේශීය
35	නැත

2.1.12 - රාජ්‍ය නර්තන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද උත්සව/ප්‍රසංග

දේශීය	විදේශීය
48	01

2.1.13 - ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් සංවිධානය කිරීම

වැඩසටහන් සංඛ්‍යාව	වියදම රුපියල්
07	**200,000.00**

2.1.14 ලේඛකාධාර ව්‍යාපෘතිය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය

පුවත්පත් දැන්වීම් සඳහා රු 75,048.00 ක්, සමීක්ෂණ මණ්ඩල ගෙවීම් සඳහා රු 182,000.00ක් සහ ලේඛකාධාර ගෙවීම සඳහා රු 2,169,684.00ක මුදලක් වැය වී ඇත.

භාෂා මාධ්‍යය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මිලදී ගත් පොත් සංඛ්‍යාව	වියදම රුපියල්
සිංහල	**66**	**2221**	**1.512.296.00**
දෙමළ	**34**	**1263**	**632,548.00**
ඉංග්‍රීසි	**01**	**27**	**24,840.00**
එකතුව	**101**	**3511**	**2,169,684.00**

මේ සඳහා සමස්ත දිවයිනේම නිසි ප්‍රචාරණයක් සිදුකළ අතර පුවත්පත් දැන්වීම් මගින් එම දැනුවත් කිරීම සිදුවිය. පුවත්පත් දැන්වීම්, සමීක්ෂකයින්ට ගෙවීම්, ලේඛකයින්ට ගෙවීම්, සමග මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමට රුපියල් විසිහතර ලක්ෂ විසි හයදහස් හත්සිය තිස් දෙකක මුදලක් (රු2,426,732.00 මුදලක්) වැය කරන ලදී

2.1.15 - ජාතික අත්පිටපත් තරඟාවලිය

2019/2021/2022 දෙමළ මාධ්‍ය/ඉංග්‍රීසි මාධ්‍ය/ සිංහල මාධ්‍ය ජාතික අත්පිටපත් තරඟාවලියේ තෝරාගත් අත්පිටපත් මුද්‍රණය කිරීම සඳහා රු 3,118,874.00ක මුදලක් වැය වී ඇත
මෙම අත්පිටපත් මුද්‍රණයේ ISBN අංක ලබා ගැනීම සඳහා රු 7,200.00ක් වැය වී ඇත

2.1.16 - සදෙස ත්‍රෛමාසික සඟරාව නිකුත් කිරීම

අංකය	කාර්යය	වියදම (රු)
01	මුද්‍රණ වියදම	**222,000.00**
02	සංස්කාරක දීමනා ගෙවීම	**49,000.00**
මුලු වියදම		**271,000.00**

2.1.17 - පොත් අළෙවිසැලෙන් ලද අදායම

2025 ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා පොත් අලෙවිසැලෙන් ලබා ගත් ආදායම රුපියල් හාරලක්ෂ අනූ දෙදහස් හයසිය තිස් හතරයි ශත පනහක් විය. (රු 492,634.50)

2.1.18 - 60 - 70 දශකයේ කලාකරු සුබසාධනය

ස්ථානය/ප්‍රදේශය	**ප්‍රසංගය පැවැත්වූ දිනය**	**වැයවූ මුදල**
නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නගර ශාලාව	**2025.09.14**	**386236.00**
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාරයාලය - ශ්‍රවණාගාරය	**2025.10.10**	**322890.00**
හින්දු සංස්කෘතික මධ්‍යස්ථානය	**2025.11.26**	**385212.00**

දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ඉහත ප්‍රසංගයන්ට අමතරව බාහිර ආයතනයන්ගේ අනුග්‍රහය යටතේ ප්‍රසංග 03ක් සංවිධානය කරන ලද අතර, එමඟින් රු 660,516.00ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත උපයා දීමට හැකි වී ඇත

අනු අංකය	**දිනය**	**ප්‍රසංගය පැවැත්වූ ස්ථානය**	**අනුග්‍රාහක ආයතනය**	**අයකරගත් මුදල (රු)**
01	**2025.10.04**	ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	සම අනුග්‍රාහක පදනම මත සිදුකරන ලදී
02	**2025.10.04**	බදුල්ල නගරය	උෟව පළාත් සභාව	**272,968.00**
03	**2025.11.25**	කන්තලේ සහ ත්‍රිකුණාමලය	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	**387,548.00**
04	**2025** වර්ෂයේ මුලු ආදායම			**660,516.00**

මේ හැරුණුකොට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් 60-70 දශකයේ සුභාවිත ගී වියමන නම් ගායක ගායිකා ප්‍රසංගයක් සංවිධානය කරන ලදී එය 2025 ඔක්තෝබර් මස 06 දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රධාන වේදිකාවෙ සිදුකරන ලදී. කොළඹ ජාත්‍යනතර පොත් ප්‍රදර්ශනයේ අවසාන දිනය වීම සහ එදිනට යෙදුණු ලෝක වැඩිහිටි දිනය මූලික කරගනිමින් මෙම ප්‍රසංගය පවත්වන ලද අතර මේ සඳහා රුපියල් දෙලක්ෂ අනූ දහසක (290,000/-) ක මුදලක් වැය විය.

2.2 ඉදිරි දැක්ම

- ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය උරුම ලැයිස්තු සම්පාදනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් දියත් කිරීම
- ජන ක්‍රීඩාව ජනගත කිරීම හා දිවයින පුරා ජනක්‍රීඩා පුහුණු වැඩසටහන් දියත් කිරීම
- අභාවයට යන අස්පර්ශනීය සංස්කෘතික උරුම සංරක්ෂණයට කටයුතු කිරීම
- සංචාරක කර්මාන්තය සඳහා සංස්කෘතික වශයෙන් ලබා දිය හැකි උත්තේජනය ලබාදීමට අදාළ වැඩසටහන් දියත් කිරීම
- වත්සර පියවර වැඩසටහන මගින් ප්‍රාදේශිය සංස්කෘතික අවශ්‍යතා සපුරාලීම
- රාජ්‍ය නර්තන හා සංගීත කණ්ඩායම් ඔස්සේ රාජ්‍ය ආදායමට නව අරමුදල් සම්පාදන මාර්ග විවර කර දීම
- දෙපාර්තමේන්තු අනුබද්ධ ආයතන සහ පොත් අළෙවිසල උපයෝගී කර ගනිමින් ආදායම් උත්පාදන මාර්ග වර්ධනය කිරීම හා ආදායම් උත්පාදන කාර්යයන්ට ප්‍රමුඛස්ථානය ලබා දීම
- දමිල මාධ්‍ය වැඩසටහන් දියත් කිරීම සහ සුභාවිත ගී වියමනේ දෙමළ මාධ්‍ය ප්‍රසංගය ප්‍රවර්ධනය කිරීම
- ළමා පරපුර ගොඩනැගීම හා චිතුළින් සංස්කෘතික මිනිසෙකු බිහිකිරීමට අදාළ නව වැඩසටහන් දියත් කිරීම
- ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපෘති දියත් කිරීම හා අනුමණ්ඩල සේවාව හරහා සිදුකළ හැකි රසවින්දනාත්මක කාර්යයන් වර්ධනය කිරීම

2.3 විශේෂ ජයග්‍රහණ

2025 වසරේ සිදුකළ රාජ්‍ය සම්මාන උත්සව ආදී ඇගයීම් කාර්යයන් හා විවිධ වැඩසටහන් දියත් කළ අතර නව්‍ය වැඩසටහන් ගණනාවක් සංවිධානය කරමින් සමාජගත කිරීමට හැකියාව ලැබිණ.

2.3.1 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඍජුවම ඉටුකළ කාර්යයන්

2.3.1. 1 **රාජ්‍ය සාහිත්‍ය සම්මාන උලෙළ 2025**

2025 සැප්තැම්බර් මස 18 වන දින අරලියගහ මන්දිරයේදී රාජ්‍ය සාහිත්‍ය සම්මාන උත්සවය ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය මැතිණියගේ ප්‍රධානත්වයෙන් බුද්ධශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමාගේ සහභාගිත්වයෙන් සිදුකරන්නට යෙදුණි 2025 වසරේ ග්‍රන්ථ විනිශ්චය සඳහා සිංහල අයදුම්පත් 2000 ක් ද දෙමළ අයදුම්පත් 520 ක් ද ඉංග්‍රිසි අයදුම්පත් 400 ක් ද ලැබී තිබුණු අතර ප්‍රශස්ත කෘති තෝරා ඒ සඳහා ඇගයීම් සිදුකරන ලදී. මෙහිදී සිංහල 25ක් ද දෙමළ 12ක් ද ඉංග්‍රීසි 09ක් ද වශයෙන් සම්මාන 46ක් පිරිනැමීය.

සාහිත්‍යවේදීන් ලේඛකයන් සහ කලාකරුවන් 1000ක පමණ පිරිසක් අරලිය ගහ මැදුරට එක්වූ අතර රුපියල් **10,997,338.69** ක පිරිවැයක් උත්සවය සඳහා දරනු ලැබීය.

ජීවිතයේ එක් වතාවක් ලැබෙන යාවජීව සම්මානය වන සාහිතය රත්න සම්මානය සෝමරත්න බාලසූරිය මහතාට ද ප්‍රේමණී අමරසිංහ මහත්මියට ද අල් අසුමත් මහතාට ද පිරිනමන ලදී.

රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානොත්සවය සාර්ථකත්වයේලා රාජ්‍ය සාහිත්‍ය උපදේශක සභාව විසින් පුරෝගාමී මෙහෙවරක නිරත විය. විශේෂ සම්මාන ලාභීන් තෝරා ගැනීම, ග්‍රන්ථ විනිශ්චය සහ උත්සව සංවිධානයේලා ඔවුන් ලබාදුන් දායකත්වය සුවිශේෂය.









2.3.1. 2 **රාජ්‍ය නර්තන උලෙළ**

2025 නොවැම්බර් මස 17 වන දින කොළඹ නෙළුම්පොකුණ රංගශාලාවේදී රාජ්‍ය නර්තන උලෙළ සිදුකරන ලදී. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකළ නර්තන උලෙළ සඳහා අයදුම්පත්‍ර 966 ක් ලැබුණු අතර සිංහල අයදුම්පත්‍ර 490 ක් සහ දෙමළ මාධ්‍ය අයදුම්පත්‍ර 476 ක් ලැබී තිබුණි. රාජ්‍ය නර්තන තරගයෙන් සිංහල හා දෙමළ මාධ්‍ය සම්මාන 54ක් දිලබාදුන් අතර යාවජීව සම්මාන තුනක් ප්‍රදානය කෙරින. මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතාට, මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතාට සහ කලාසූරී ශිවානන්දි හරිදර්ශන් මහතමියට මෙම ජීවිතයේ එක් වරක් පමණක් හිමිවන යාවජීව සම්මානයය පිරිනමන ලදී.

සම්මාන උත්සවය සඳහා 1000කට අධික පිරිසක් සහභාගි වූ අතර රුපියල් **10,411,810.56** මුදලක් වැය කෙරිණ.

2.3.1. 4 **රාජ්‍ය සාහිත්‍ය දේශනය**

2025 වසරේ සිදුකළ රාජ්‍ය සාහිත්‍ය දේශනය 2025 සැප්තැම්බර් මස 10 වන දින මහාචාර්ය ලියනගේ අමරකීර්ති මහතාගේ සහ ජයතිලක කම්මැල්ලවීර මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී සිදුකෙරින.





ආරාධිත පිරිස සාහිත්‍ය කෙෂ්ත්‍රයේ ක්‍රියාකාරීන් වූ අතර 500 ක පමණ පිරිසක් මේ සඳහා සහභාගි විය. රාජ්‍ය සාහිත්‍ය දේශනය සඳහා රුපියල් 650,536.62ක මුදලක් වැය විය.

2.3.1. 5 **රූපවාහිනී රාජ්‍ය සම්මාන උලෙළ**

රූපවාහිනී රාජ්‍ය සම්මාන උලෙළ වසර කිහිපයකට පසුව 2025 දෙසැම්බර් මස 22 දින සහ 23 වන දින ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරයේදී සිදුකෙරිණ. බුද්ධශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කළ මෙම උත්සවයේදී 2021 සිට 2024 වර්ෂවල ඇගයීම් දෙසැම්බර් මස 22වන දින ද 2025 වසරේ ඇගයීම් දෙසැමබර් මස 23 වන දින ද සිදුකරන ලදී. මේ සඳහා ලැබුණු සමස්ත අයදුම්පත් සංඛ්‍යාව 800ක් වූ අතර 2021 සිට 2024 වර්ෂවල සම්මාන 62 ක් කුෂලතා 14ක් සමග ජූරියේ විශේෂ ඇගයීම් සහතික පත්‍ර 05 ලබාදෙන්නට යෙදුණි.






2025 වර්ෂය සඳහා සම්මාන 44 ක් කුෂලතා 09ක් සමග ජූරියේ විශේෂ ඇගයීම් සහතික පත්‍ර 01 ක් වශයෙන් නිර්මාණකරුවන් ඇගයීමට කටයුතු කරන ලදී. දින දෙකක් පුරා ක්‍රියාත්මක කළ මෙම උත්සවය සඳහා රුපියල් **6,248,637.84** ක මුදලක් වැය විය.







2.3.1. 6 **අස්පර්ශනීය උරුම වැඩසටහන් හා ව්‍යාපෘති**

2.3.1. 6.1 **ලෝක රූකඩ දින සැමරුම**

2025 වසරේ ලෝක රූකඩ දින සැමරුම බුද්ධශාසන ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශයේ උපදේශකත්වයෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා කලා මණ්ඩලය සහ එහි රාජ්‍ය අස්පර්ශනීය කලා උරුම සහ සාම්ප්‍රදායික කලා අනුමණ්ඩලය විසින් සංවිධානය කරන ලදී

මේ අනුව 2025 මාර්තු මස 20 වන දින බලපිටිය ප්‍රාදේශිය සභා ශ්‍රවණාගාරයේදී අති උත්කර්ෂවත්ව සිදුකරන ලදී

2025 ලෝක රූකඩ දින සැමරුමේ සුවිශේෂත්වය වන්නේ සාම්ප්‍රදායික අම්බලන්ගොඩ නූල් රූකඩ පරපුර මුලික කර ගනිමින් ඔවුන්ගේ නිර්මාණ ශක්‍යතා ඉදිරිපත් කිරීමේ අවස්ථාව සලසා දෙමින් මෙම රූකඩ ප්‍රසංගය සංවිධානය කිරීමය. මෙහිදී දැනට හදුනාගත් අම්බලන්ගොඩ හා බලපිටිය සාම්ප්‍රදායික නූල් රූකඩ කණ්ඩායම් 10ක් ලෝක රූකඩ දින සැමරුමට දායක කර ගන්නා ලදී.

මේ සඳහා 500කට ආසන්න පිරිසක් සහභාගි වූ අතර උත්සවය සඳහා රුපියල් **516,400.00** මුදලක් වැය වූ අතර සමස්ත වැඩසටහන වීඩියෝ පටිගත කිරීම සිදුකර එය සුරක්ෂා ක්‍රියාමාර්ගයක් ලෙස සංරක්ෂණයට කටයුතු කරන ලදී.

2.3.1.6.2 **අතුරු මිතුරු ළමා කතන්දර හා කවි ගායනා වැඩසටහන**

වර්තමානයේ ජන සමාජයෙන් වියැකී යන ළමා කතන්දර කීම යලිදු සමාජගත කිරීම සඳහා අතුරු මිතුරු නම් ළමා කතන්දර සහ කවි ගායනා වැඩසටහනක් අභිනවයෙන් 2025 වසරෙ දී ආරම්භ කරන ලදී. මෙම වැඩසටහනේ මංගල වැඩසටහන 2025 අගෝස්තු මස 30 වන දින ජාතික කලාභවන පරිශ්‍රයේදී සිදුකෙරිණ. මේ සඳහා දරුවන් සහ දෙමාපියන් 250කට ආසන්න පිරිසක් සහභාගි වූ අතර මහාචාර්ය චිරංගා සමින්දිනි වීරක්කොඩි මහත්මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහින්ද කුමාර දලුපොත මහතා සහ රාජ්‍ය සංගීත කණ්ඩායම සිය දායකත්වය සැපයීය.

රාජ්‍ය අස්පර්ශනීය කලා උරුම සහ සාම්ප්‍රදායික කලා අනුමණ්ඩලයේද යෝජනාවක් පරිදි සංවිධානය වූ මෙම වැඩසටහන සඳහා රුපියල් **84,742.00** ක මුදලක් වැය විය.

2.3.1.6.3 **සූසැට කලා මංගල්‍යය හා ලෝක ළමා දින සැමරුම**

කොළඹ පොත් සංගමය විසින් සංවිධානය කරන කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී විශාල මහජන ප්‍රතිචාර රැසක් මධ්‍යයේ ශ්‍රී ලාංකේය අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අදාළ කලාංග ප්‍රකටනය කරමින්

සූසැට කලා මංගල්‍යය සමග ලෝක ළමා දින සැමරුම සිදුකරන ලදී සැප්තැම්බර් මස 27 වන දින සිට ඔක්තෝබර් මස 06 වන දින දක්වා අදාළ වැඩසටහන් මාලාව දියත් කෙරුණි.



මෙහිදී 50 - 60 - 70 දශකයේ ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයේ ජනාදරයට පත් කලාකරුවන් ගීත ගායනයෙන් දායකත්වය සැපයූ අතර ලෝක වැඩිහිටි දිනය මුලික කර ගනිමින් 60 - 70 දශකයේ වැඩිහිටි කලාකරුවන් සුපුරුදු පරිදි මෙම ප්‍රසංගය වර්ණවත් කළෝය.

වැඩසටහන සඳහා සමස්ත වියදම රුපියල් **407,165.00** ක් විය

2.3.1.6.3 **අස්පර්ශනීය උරුම පුහුණු ව්‍යාපෘතිය වයඹ පළාත**

ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය ලැයිස්තුව සම්පාදනය කිරීම උදෙසා එකඟ වී ඇති යුනෙස්කෝ සම්මුතියට අනුව එම ලැයිස්තුව සම්පාදනය සඳහා නිලධාරීන්ට යුනෙස්කෝ මාර්ගෝපදේශ හා සංරක්ෂණ ක්‍රියාමාර්ග සහිත පුහුණුවක් ලබාදීමේ අවශ්‍යතාව ඉටුකරමින් සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරීන්ට වයඹ පුහුණු මධ්‍යස්ථානයේදී අස්පර්ශනීය උරුම පුහුණු වැඩසටහන දියත් කරන ලදී. 2025 අගෝස්තු මස 12,13,14 තෙදින මෙම වැඩසටහන නේවාසික වැඩසටහනක් වශයෙන් සිදුකළ අතර යුනෙස්කෝ වරලත් උපදේශකයන් වන මහාචාර්ය බී.ඩී නන්දදේව මහතා, මහාචාර්ය ගාමිනී විජෙසුරිය මහතා, සමග ආචාර්ය උදය කබ්රාල් මහතා සහ වෛද්‍ය ඩැනිස්ටර් පෙරේරා මහතා මේ සඳහා උපදේශන දායකත්වය සැපයීය සමස්ත වැඩසටහන සඳහා රුපියල් **394,535.00** ක පිරිවැයක් දැරීමට සිදු වූ අතර එහි කාර්ය සාධනය පිළිබඳ එක් දින වැඩසටහනක් ද සිදු කෙරිණ.

2.3.1.6.4 **අස්පර්ශනීය උරුම පුහුණු ව්‍යාපෘතිය උතුරු පළාත**

වයඹ පළාත් පුහුණුවට අදාළ දෙමළ භාෂා පුහුණු වැඩසටහන යාපනයේදී සිදුකරන්නට යෙදුණි. දෙමළ ජාතීන් අතර පවතින අස්පර්ශනීය උරුමය සහ පැවති යුද්ධයෙන් පසුව එම උරුමය හා සාම්ප්‍රදායික ඥානය වියැකී යාමේ දැඩි ගැටලුවක් හදුනා ගත් බැවින් උතුරු පළාත සඳහා ද අස්පර්ශනීය උරුම පුහුණු වැඩසටහනක් සංවිධානය කරන්නට යෙදුණි.

මේ සඳහා ශ්‍රී ලංකා යුනෙස්කෝ කොමිෂන් සභාව විසින් මුල්‍ය දායකත්වය සැපයූ අතර සියලු සංවිධාන කටයුතු සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. 2025 දෙසැම්බර් මස 16 සිට 19 දක්වා දින 04ක පුහුණු වැඩසටහනක් මෙහිදී ක්‍රියාත්මක කළ අතර යුනෙස්කෝ කොමිෂන් සභාව විසින් ඒ සඳහා වැය වූ රුපියල් **758,230.00** ක මුල්‍ය දායකත්වය ලබාදෙන ලදී.





2.3.1.6.5 **සබරගමු සාම්ප්‍රදායික කලාංග සුරක්ෂාව - පහන්මඩු ශාන්තිකර්මය සංරක්ෂණය**

ශ්‍රී ලංකා කලා මණ්ඩල ව්‍යාපෘතියක් වශයෙන් එහි අනුග්‍රාහකත්වය සහිතව සබරගමු කලාංග සුරක්ෂා කිරීමේ අවශ්‍යතාව රාජ්‍ය අස්පර්ශනීය කලා උරුම සහ සාම්ප්‍රදායික කලා අනුමණ්ඩලයේ යොජනාවක් පරිදි සබරගමු ප්‍රදේශයේ ගවේෂණයක් සිදුකොට හදුනාගත් සාම්ප්‍රදායික පහන්මඩු ශාන්තිකර්මය සුරක්ෂා කිරීම පිණිස වීඩියෝ පටිගත කිරීමක් සිදුකරන ලදී. මෙය බලන්ගොඩ ඉඹුල්පේ කුඹල්මුල ශ්‍රී පත්තිනි දෙවාලයේ සාම්ප්‍රදායික පහන් මඩු ශාන්තිකර්මය වූ අතර දැනට වියැකී යන ශාන්තිකර්මයක් වශයෙන් හා අදාළ කපු පරපුරෙන් පසුව තවදුරටත් සිදුකළ නොහැකි කලාංගයක් ලෙස හදුනා ගත් බැවින් සංරක්ෂණ ක්‍රියාමාර්ග ගන්නා ලදී මේ සඳහා රුපියල් **207,130.00** ක මුදලක් ද අදාළ ගවේෂණය සඳහා රුපියල් 115,000 ක මුදලක්ද වැය වූ අතර සමස්ත වියදම ශ්‍රී ලංකා කලා මණ්ඩලය මගින් දරන ලදී. අදාළ සංරක්ෂණ වැඩසටහන 2025 දෙසැම්බර් මස 23 හා 24 දෙදින කුඹල්මුල දී සිදු කෙරිණ.

2.3.1.6.6 **පොසොන් හේවිසි පූජා සංරක්ෂණය**

රාජ්‍ය අස්පර්ශනීය කලා උරුම සහ සාම්ප්‍රදායික කලා අනුමණ්ඩල යෝජනාවක් පරිදි ක්‍රමිකව අභාවයට යන පොහොය හේවිසි වාදනය සංරක්ෂණය මුලික කොට ගත් වැඩසටහනක් වශයෙන් අනුරාධපුර රුවන්වැලි සෑයේ සිදුකළ පොසොන් හේවිසි පූජාව සංරක්ෂණයට කටයුතු කරන ලදී මෙය 2025 වසරේ ජූනි මස 09 සහ 10 දෙදින රුවන්වැලි සෑ පරිශ්‍රයේදී සිදුකළ අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාපා නාලිකාව විසින් අදාළ සංරක්ෂණ පටිගත කිරීම සිදුකරන ලදි. මේ සඳහා රුපියල් **111,920.00** ක මුදලක් වැය විය.

2.3.1.7 **පොසොන් හේවිසි පූජාව**

සෑම වසරකම පොසොන් පොහොය මුලික කරගනිමින් අනුරාධපුර රුවන්වැලි මහ සෑ රදුන් අභිමුව සිදුකරන රාජ්‍ය පොසොන් හේවිසි පූජාව 37වන වරටත් 2025 ජූනි මස 10 දින සිදුකෙරිණ. රැය පහන්වන තුරු පැවති මෙම හේවිසි පූජාව සඳහා බැතිමතුන් විශාල පිරිසක් නරඹන්නන් ලෙස සහභාගිවිය. සමස්ත වැඩසටහන සඳහා රුපියල් 511,675.00 ක මුදලක් වැය විය. රාජ්‍ය පොසොන් හේවිසි පූජාව වාර්ෂිකව නැරඹීමට ඇලුම් කරන පිරිසක් ද මේ වන විට ගොඩනැගි තිබීමද සතුටට කරුණක් විය.

2.3.1, 8 **චිත්‍ර සංරක්ෂණය හා වැඩමුළු පැවැත්වීම**

2025 වර්ෂයේදී චිත්‍ර සංරක්ෂණ වැඩමුළු නොපැවැතින. චිත්‍ර සංරක්ෂණයට අවශ්‍ය උපකරණ දේශීය හි විදේශිය වශයෙන් මිලදී ගැනීම සිදුකළ අතර ඒ සඳහා රුපියල් මිලියන 0.823ක මුදලක් වැයවිය.

2.3.1, 12 **දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සාහිත්‍ය උත්සව**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341 ක සාහිත්‍ය උත්සව පවත්වන ලද අතර ඒ සඳහා රුපියල් **11,935,000.00** ක ප්‍රතිපාදනයන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන ලදී. එමෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල25 ක සාහිත්‍ය උත්සව සඳහා රුපියල් **1,250,000.00** ක මුදලක් ලබාදීමට කටයුතු කළ අතර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය උත්සව සහතික පත්‍ර සඳහා රුපියල් **663,751.30** ක මුදලක් වන පරිදි සමස්ත දිස්ත්‍රික් හා ප්‍රාදේශිය උත්සව සඳහා රුපියල් **13,848,751.30** ක මුදලක් වැය කෙරින. මෙහිදී සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් සඳහා රුපියල් 35000ක මුදලක් ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් සඳහා රුපියල් 50000ක මුදල් ප්‍රතිපාදනයක් ද ලබාදීමට කටයුතු කරන ලදී. නමුත් එම මුදල් ප්‍රමාණවත් නොවන බැවින් එම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් විසින් තම ආයතන ප්‍රධානියාගේ සහයෝගය ඇතිව එම ප්‍රදේශවලින් අනුග්‍රාහක භවතුන් සම්බන්ධකර ගැනීමට කටයුතු කරන ලදී.

දිස්ත්‍රික් හා ප්‍රාදේශිය වශයෙන් පවත්වන ලද සෑම උත්සවයක්ම ඉතා වර්ණවත් අයුරින් ද එම ප්‍රදේශයේ හෝ කාර්යාලයේ සම්පත් හා ශක්‍යතාව උපරිම අයුරින් භාවිත කරමින් උත්සව සංවිධානය වූ අතර පාසල් සිසුන් කලායතන සිසුන් මෙන්ම සංස්කෘතික බලමණ්ඩල සාමාජික සාමාජිකාවන් ද ප්‍රදේශයේ කලාකරුවන් ද මේ සඳහා සහභාගි වී ඇති බව සඳහන් ය. මේ අතර බොහෝ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිවයිනේ ප්‍රමුඛ පෙලේ විද්වතෙකු සාහිත්‍යධරයෙකු හෝ කලාකරුවෙකු මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරාධනා කර සම්බන්ධ කර ගන්නා ලදී.

2.3.1, 13 **වියමන ලේඛකත්ව වැඩසටහන**

නිර්මාණාත්මක ලේඛනය සම්බන්ධයෙන් නවකයන් දැනුවත් කිරීම සහ ප්‍රවීණයන්ට වුවද නිසි තාක්ෂණය ලබාදීම උදෙසා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රාජ්‍ය සාහිත්‍ය උපදේශක මණ්ඩලය සහ ශ්‍රී ලංකා කලා මණ්ඩලය එක්ව සංවිධානය කරන මෙම වැඩසටහන යටතේ 2025 වසරේදී ද සිදු කෙරිණ

2025 ඔක්තෝබර් මස 18 වන දින යාපනයේදී සිදුකළ වියමන වැඩසටහන සඳහා රුපියල් **274,730.00**ක මුදලක් වැය කෙරිණ

2.3.1, 15 **සම්භාෂණ මාසික සාහිත්‍ය දේශනය**

සම්භාෂණ සාහිත්‍ය දේශන කොළඹ, හැටන්, මහනුවර සහ අනුරාධපුරයේදී සිදුකෙරිණ, 2025 මාර්තු මස 26 වන දින කොළඹ දී ද 2025 මැයි මස 17 වන දින හැටන් හි ද 2025 ජූනි මස 21 වන දින මහනුවරදී ද 2025 ජූලි මස 25 වන දින අනුරාධපුරයේදී ද සිදුකළ සම්භාෂණ සාහිත්‍ය වැඩසටහන් සඳහා රුපියල් 96,490ක මුදලක් වැය විය.

2.3.2 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අනුබද්ධ ආයතන හරහා සිදුකළ කාර්යයන්

2.3.2.1 ජෝන් ද සිල්වා සමරු රඟහල

ජෝන් ද සිල්වා සමරු රඟහලේ ඉදිකිරීමේ කාර්යයන් 2023 වසර අවසානය වන විට ද පැවති බැවින් එහි ආදායම් උත්පාදන කාර්යය සිදුකිරීමට අවකාශ නොවීය.

2.3.2.2 එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු හා පර්යේෂණ ආයතනය

අනු අංකය	වැඩසටහන	දිනය	වියදම
1.	රංගාවතරණ වැඩමුලුව	**2025.08.28-29**	රු **34,500.00**

2.3.2.3 සිංහල ශබ්දකෝෂ කාර්යාලය

අනු අංකය	වැඩසටහන	වියදම
1.	සිංහල සිංහල ශබ්දකෝෂ දෙවන භාගය මුද්‍රණය කිරීම	1,119,666.60
2.	සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂය පරිගණක ගත කිරීම සඳහා ගෙවීම	302,200.00
3.	ශබ්දකෝෂ ප්‍රවර්ධන වැඩසටහන්	29,500.00
4.	**Domain registry**	10,000.00
5.	සිංහල ඉංග්‍රීසි 31 කලාපය සෝදුපත් බැලීම	100,000.00
6.	පැරණි ප්‍රකාශන නැවත මුද්‍රණය	279,058.00
එකතුව		**1,840,424.60**

2.3.2.5 සිංහල විශ්වකෝෂ කාර්යාලය

සිංහල විශ්වකෝෂයේ මුද්‍රිත කලාප අන්තර්ජාල ගත කිරීමේ කාර්ය පමණක් සිදු කරයි. ඒ අනුව මේ වන විට සිංහල විශ්වකෝෂයේ 04 වෙනි බාණ්ඩය දක්වා අන්තර්ජාලගත කර අවසන් කර ඇත.

2.3.2.6 මහාවංස සම්පාදන කාර්යාලය

මහාවංශයේ ඉංග්‍රීසි පරිවර්තනය සංස්කරණය අවසන්ව මුද්‍රණයට සූදානම් ව ඇත.

2.3.2.7 කුණ්ඩසාලයේ ජාතික කලා නිකේතනය

අනු අංකය	වැඩසටහන	දිනය	වියදම
1.	පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහන	**2025.10.03**	**169,836.00**
2.	සොකරි නාට්‍යාංගය	**2025.11.01**	**85,807.00**
එකතුව			**255,643.00**

2.3.2.8 දොළොස්මහේ පහන වැඩසටහන - ප්‍රාදේශීය ලේකම් කාර්යාල 335 සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 (කාර්යාල 26කි)

අනු අංකය	වැඩසටහන	ලබාදුන් ප්‍රතිපාදන රු.
1.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 335ක් සඳහා ප්‍රතිපාදන යොමු කිරීම (335x25,000.00)	**8,375,000.00**
2.	දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් සඳහා ප්‍රතිපාදන යොමු කිරීම (අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා දෙමළ සිංහල වැඩසටහන් වෙනුවෙන් වෙනවෙනම 25000.00 x 2 = 50000.00 ක මුදලක් ලබා දී ඇත)	**650,000.00**
එකතුව		9,025,000.00

2.3.2.9 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතිය	ප්‍රතිපාදිත මුදල	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
1.	ජාතික කලා භවන	රු.මි **120**	**25.196**	**25%**
2.	මිහින්තලය උතුරු දකුණු මිතුරු සෙවන	රු.මි **3**	**2.79**	**100%**
3.	ජොන් ද සිල්වා සමරු රඟහල	රු.මි **500**	**0.21**	--
එකතුව		රු.මි **623**	**28.51**	

2.4 අභියෝග හා ඉදිරි ඉලක්ක

2.4.1 ඉලක්ක

කලාකරුවන් වෙනුවෙන්

- කලාකරුවන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීම
- කලාකරුවන්ට සම අවස්ථා ලබා දීම

කලා නිර්මාණ වෙනුවෙන්

- උසස් රසවින්දනයක් ඇති කිරීම සඳහා කලා නිර්මාණයන්හි ප්‍රමිතිය ඉහල නැංවීම
- සාම්ප්‍රදායික කලා නිර්මාණ ජනගත කිරීම

කලා ආයතන වෙනුවෙන්

- ප්‍රශස්ත සේවාව
- දීප ව්‍යාප්ත සේවාව

කලා සංගම් වෙනුවෙන්

- ප්‍රශස්ත සේවාව
- දීප ව්‍යාප්ත සේවාව

නිලධාරීන් වෙනුවෙන්

- වගකීමෙන් හා වගවීමෙන් ඵලදායීව කටයුතු කරන රාජ්‍ය සේවකයෙකු බිහිකිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම

මහජනතාව වෙනුවෙන්

- ශික්ෂාකාමී ජන සමාජයක් ගොඩනැඟීමට අවශ්‍ය පසුබිම සැකසීම
- උසස් රසවින්දනයක් ඇති කිරීමට කටයුතු කිරීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් ඉලක්ක මුදුන්පත් කර ගැනීමේ කාර්යයන් දියත් කෙරෙන අතර ඒ අනුව

- කලාකරු සුබසාධන කාර්යයන් ඉටුකිරීම
- සම්මාන උළෙල හරහා කලාකරුවන් හා නිර්මාණ ඇගයීමට භාජනය කිරීම
- දොළොස්මගේ පහණ වැඩසටහන හරහා දිස්ත්‍රික් මට්ටම/ප්‍රාදේශීය මට්ටම හා ග්‍රාමීය මට්ටම දක්වා වැඩසටහන් දියත් කිරීම
- කලායතන ආධාර වැඩසටහන් හා කලායතන සඳහා විවිධ අවස්ථා සම්පාදනය කර දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා කාර්යමණ්ඩල පුහුණු හා වැඩසටහන් දියත් කිරීම

සිදු කෙරෙන අතර එමගින් දෙපාර්තමේන්තු ඉලක්ක සපුරා ගැනීමට බලාපොරොත්තු වේ.

2.4.2 අභියෝග

- වසර අවසාන භාගය වන විට දිට්වා ව්‍යසනය බලපැවැත්වීම හේතුවෙන් රාජ්‍ය සම්මාන උළෙල කිහිපයක් 2025 වසරේදී සිදු කිරීමට නොහැකි විය. එම සියලු උත්සවයන්හි මූලික කාර්යයන් සිදුකර අවසන් කර තිබියදී එම උත්සව 2026 වසරට ගෙනයාමට සිදුවිය.

- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් සිදුකරන වැඩසටහන් සඳහා සහ ප්‍රාදේශීය සාහිත්‍ය උත්සව ආදියට ලබාදෙන ප්‍රතිපාදන වාර්ෂිකව වැඩසටහන් දියත් කිරීමට ප්‍රමාණවත් නොවීම සහ පවත්නා සම්පත් භාවිතාව මගින් වැඩසටහන් අනිවාර්යයෙන් ඉටුකිරීමට වීම එම නිලධාරීන්ට අභියෝගයකි. විශේෂයෙන් දොළොස්මහේ පහන වැඩසටහන හරහා ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටම දක්වා වැඩසටහන් දියත් කිරීමට සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් ඇති බැවින් අදාළ වැඩසටහන් සිදුකිරීමේ දුෂ්කරතා පැන නැගුණු අතර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් මුල්‍ය පිරිවැය නොදරා සිදුකරන කාර්යයන් රැසක් දියත් කිරීමට ක්‍රියා කළහ.

- අරමුදල් සීමාවීම සහ එක් එක් වැය ශීර්ෂවලට ලැබෙන මුදල් පවත්නා මිල මට්ටම සහ විවිධ ඉල්ලීම් අනුව සිදු කරගත නොහැකි තත්ත්වයක් පවතී. විශේෂයෙන්ම විවිධ උත්සව හා වැඩසටහන් සඳහා බැහැර පාර්ශ්වයන් විසින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සහ රජයේ අනුග්‍රාහකත්වය බලාපොරොත්තු වන තත්ත්වයක ඒ සියලු කාර්යයන් ට දායක වීමට නොහැකිවීම සහ අවශ්‍ය පරිදි අරමුදල් නොමැතිවීමට මුහුණ දී ඇත.

- ඉදිකිරීම් සහ නඩත්තු කාර්යයන් සඳහා ද අවශ්‍ය පරිදි ප්‍රතිපාදන නොමැතිකම තවද අභියෝගයන්ට මුහුණ පෑ අවස්ථාවන් විය. ජොන් ද සිල්වා සමරු රඟහල ඉදිකිරීම සම්බන්ධයෙන් නිරන්තරව කලාකරුවන් කරන විමසීමද අනුබද්ධ ආයතනවල අවශ්‍යතා ඉටුකර ගැනීමේ ඉල්ලීම් ඉටු කිරීමට තිබෙන ගැටලුව දෙපාර්තමේන්තුව මුහුණ පෑ අභියෝගයන්ය.

3 පරිච්ඡේදය 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මුල්‍ය කාර්ය සාධනය

3.1 මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලසීමාව සඳහා වන මුල්‍ය කාර්ය සාධනය

අයවැය 2023		සටහන	2025	2024	
	ආදායම් ලැබීම්				
	ආදායම් බදු	1			
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2			ඒ.සි.ඒ 1
	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3			
	බදු නොවන ආදායම සහ වෙනත්	4			
	මුළු ආදායම් ලැබීම් (අ)				
	ආදායම් නොවන ලැබීම්				
	භාණ්ඩාගාර අග්‍රිම		**779,880,000**	**686,216,000**	ඒ.සි.ඒ 3
	තැන්පතු		**4,073,297**	**1,044,499**	ඒ.සි.ඒ 4
	අත්තිකාරම් ගිණුම්		**30,837,288**	**26,484,536**	ඒ.සි.ඒ 5/5(අ)
	වෙනත් ලැබීම්				
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**814,790,585**	**713,745,035**	
	මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් (අ)+ (ආ)		**814,790,585**	**713,745,035**	
	භාණ්ඩාගාරය ප්‍රේෂණ (ඇ)				
	ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නෙවන ලැබීම් ඉ - (ඇ) - (ඈ)		**814,790,585**	**713,745,035**	
	අඩුකලා වියදම				
	පුනරාවර්තන වියදම				
	වේතන වැටුප් සහ අනෙක් සේවක ප්‍රතිලාභ	5	609,845,633	**516,557,398**	
	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	224,459,199	200,053,484	
	සහනාධාර, සහනාධාර මාරු කිරීම	7	58,569,590	55,670,765	ඒ.සි.ඒ 2(11)
	පොලී ගෙවීම	8			
	වෙනත් පුනරාවර්තන	9			
	මුළු පුනරාවර්තන වියදම (ඈ)		**892,874,422**	**772,281,647**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම	10	38,000,900	**18,417,394**	
	මුලධන වත්කම් අත්පත් කර ගැනීම	11	**7,748,574**	**4,927,460**	
	ප්‍රාග්ධන මාරුකිරීම	12			
	මුලධන වත්කම් අත්පත් කර ගැනීම	13			
	හැකියා වර්ධනය	14	**147,106**	**817,019**	
	වෙනත් මූලධන වත්කම්	15			
	මුළු මූලධන වියදම (උ)		**45,896,580**	**24,161,873**	
	ප්‍රධාන ලෙජර් වියදම (උඅ)				
	තැන්පතු ගෙවීම්		**3,426,303**	**4,466,513**	ඒ.සි.ඒ 4
	අත්තිකාරම් ගෙවීම්		**40,266,672**	**30,488,398**	ඒ.සි.ඒ 5
	ප්‍රධාන ලෙජර් වියදම (උඅ)		**43,692,975**	**34,954,911**	
	මුළු වියදම ඒ=(උ+උඅ+ඊ)		**982,463,977**	**831,398,431**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ - (ඉ-ඒ)		**(167,673,392)**	**(117,653,396)**	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**(167,673,392)**	**(117,653,396)**	ඒසිඒ -3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඊසීඒ-පී

	සටහන	කප්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,478,708,452.78	1,390,055,801.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	85,397,224.79	75,967,841.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**1,564,105,677.57**	**1,466,023,642.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		71,551,485.76	62,769,096.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,478,708,452.78	1,390,055,801.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසීඒ-4	13,845,739.03	13,198,745.00
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**1,564,105,677.57**	**1,466,023,642.00**

පිටු අංක.....සිට ..... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..... සිට ..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

ප්‍රින්ස් සේනාධීර
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
08 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2026/02/23

තේ.එස්. දිල්හානි
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2026/02/23

ඩී.එම්.ජේ.එස්. දිසානායක
ගණකාධිකාරි
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

	සටහන	2024රුපියල්	2023 රුපියල්
මූල්‍ය නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	ඊසීඒ-6	1,390,055,801.00	1,325,765,864
මූල්‍ය වත්කම්			
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම් විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකනාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම් වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලැසුම් කිරීම් පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල වපුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල වපුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අත්තිකාරම් ගෙවීම්

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන රු.444,761 ක වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොනිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය ප්‍රකාරව නවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් තිබෙ නමුත්, ඒවා නිසි පරිදි හඳුනා ගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගැනීමට නොහැකි නම් තක්සේරු කළ අගයට ගිණුම් ගත කළ යුතු අතර 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරවද වසර 2020 වන විට තම ආයතනය සතු සියළුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර අවසන් කළ යුතු වේ. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ද දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කරනු ලබන ගොඩනැගිලි සහිත ඉඩම් 03 ක් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොනිබුණි.

(ආ) 2025 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව සතුව වාහන 26 න් 20 ක් ගිණුම්ගත කර නිබුණු අතර 6 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොනිබුණි. ගිණුම්ගත නොකළ වාහන 6 න් 5 ක අයිතිය දෙපාර්තමේන්තුව සතුව පැවති අතර ඉතිරි වාහනයේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොනිබුණි.

(ඇ) මූල්‍ය නොවන වත්කම් තුළ එක් වාහනයක වටිනාකම් දෙවරක් ගිණුම්ගත වීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් රු.5,900,000 කින් වැඩියෙන් දක්වා නිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනයේ (ACA2(i)) මූලධන වත්කම් අත්පත් කර ගැනීම් සඳහා දරන ලද මුළු වියදම්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ACA 6 ආකෘතියේ) වර්ෂයේ මිලදී ගැනීම්වල වටිනාකමට සමාන විය යුතුය. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනයේ (ACA2(i)) මූලධන වත්කම් අත්පත්කර ගැනීම් වැය විෂයයන් වූ 2102, 2103 හා 2104 යටතේ පිළිවෙලින් රු.1,810,690, රු.2,933,785 හා රු.3,004,099 ක් බැගින් එකතුව රු.7,748,575 ක මුළු වියදමක් දරා තිබුණද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය හෙවත් ACA 6 ආකෘතියේ වර්ෂයේ මිලදී ගැනීම්වල වටිනාකම් රු.4,950,297 ක් ලෙස ඇතුළත් කර තිබුණි. ඒ අනුව රු.2,798,278 ක මූලධන වත්කම් අත්පත් කර ගැනීම් සඳහා දරන ලද වියදම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට (ACA 6 ආකෘතියට) ඇතුළත් කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බිම් ගිණුමේ හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන රු.444,761 ක වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.	1.6.1
1.6.1.(ආ) (II)(III)	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් නිබේ නම්, ඒවා නිසි පරිදි හඳුනා ගෙන පිරිවැයට	1.6.2 (අ)(ආ)

හෝ තක්සේරු කළ අගයට ගිණුම් ගත කළ යුතු අතර 2020 වන විට තම ආයතනය සතු සියළුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර අවසන් කළ යුතු වේ. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ද දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කරනු ලබන ගොඩනැගිලි සහිත ඉඩම් 03 ක් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර දෙපාර්තමේන්තුව සතු වාහන 6 ක් ගිණුම්ගත කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) මූදල් රෙගුලාසි 50 ප්‍රකාරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී නිසි කාර්යක්ෂමතාවයකින් හා සකසුරුවම්කමකින් සිදුකළ යුතු වුවත්, වැය විෂයයන් 10 කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.309,300,000 ක් හා සංශෝධිත ප්‍රතිපාදනය රු.403,640,708 ක් වූ අතර ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය හා සංශෝධිත ප්‍රතිපාදනය වෙනස්වීම් සියයට 32– 115 අතර අගය පරාසයක් ගෙන තිබුණි.

(ආ) වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් නිසිලෙස සිදු නොකිරීම් හා නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම් හේතුවෙන් 206-1-1-0-1401 සහ 206-2-2-0-1002 යන පුනරාවර්තන වැය විෂයයන් දෙක සඳහා වෙන් කරන ලද රු.4,589,083 ක සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) මූලධන වැය විෂයයන් 6 ක් සහ පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.654,550,000 ක ප්‍රතිපාදනයෙන් රු.612,371,325 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එම ප්‍රතිපාදන ඉතිරි වීම් අදාළ වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 38 සිට 99 දක්වා අගය පරාසයක පැවතුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මූදල් රෙගුලාසි 211(i) සහ මූ.රෙ.447 ප්‍රකාරව සියලුම බැරකම් ඒවා සිදු වූ විගාම බැරකම් ලේඛනයේ සටහන් කළ යුතු වුවත්, 2025 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 04 කට අදාළව ගෙවන ලද එකතුව රු. 2,971,770 ක් වූ බැඳීම් හා බැරකම්, බැරකම් ලේඛනයේ සටහන් කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. (අදාල සහතිකවීම් පිලිබඳ ප්‍රකාශනයක් 2025 වර්ෂයේ මූල්‍ය නත්ත්වය පිලිබඳ ප්‍රකාශනයට පහලින් ඇතුලත් කර ඇත.)

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම් සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.2 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
i	XXIV පරිච්ඡේදයේ උපවගන්තිය	3.7 ආපදා ණය මුදල් ගෙවන ලද දිනයේ සිට නියමිත ප්‍රමාණයට පොළිය අයකළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණු

		අතර ණය මුදල් ලබා දුන් මාසය සඳහා පොළිය අයකර නොතිබුණි.
ii	XXIV පරිච්ඡේදයේ 4.5 ඡේදය	අත්තිකාරම් බී ගිණුම අනුව සේවය අතහැර ගොස්, වසර 05 ක් ඉක්මවූ එක් නිලධාරියෙකුගෙන්ද, වසර 03-05 වූ අතර නිලධාරීන් තිදෙනෙකුගෙන්ද, වසර 1-3 අතර නිලධාරීන් දෙදෙනෙකුගෙන් හා වසර එකට අඩු නිලධාරීන් තිදෙනෙකුගෙන්ද ලෙස සේවය හැරගිය නිලධාරීන් 9 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.631,429 ක් වූ ණය ශේෂ අදාල සේවකයන්ගෙන් අයකර ගැනීමට නොහැකි වන්නේ නම් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 ඡේදය ප්‍රකාරව අදාල ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ නොවන අවස්ථා වලදී සුදුසු පරිදි නිහිමය සියවර ගැනීමට හෝ කටයුතු කල යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i	මුදල් රෙගුලාසි 103(1)(ආ)	කලා භවනේ චිත්‍ර අස්ථානගත වීම සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂක විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව පොලිසියට වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි.
ii	මුදල් රෙගුලාසි 103(1)(ඇ)	නැතිවීම් හා හානිවීම් සම්බන්ධ පොත්පත් වාර්තා ආදිය සුරක්ෂිතව තැබීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන යෙදිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.
iii	මුදල් රෙගුලාසි 104(1)(ඉ)	පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත්,

		එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කල යුතු වුවත්, සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂක කලා භවනේ චිත්‍ර අස්ථානගතවීම් සම්බන්ධයෙන් කිසිදු ප්‍රමාණාත්මක පියවරක් ගෙන නොතිබුණු අතර චිත්‍ර 42 ක වෙනස සම්බන්ධයෙන් වාර්තා කරන ලෙස ස්ථානභාර නිලධාරී හා උප අභිරක්ෂක වෙත උපදෙස් දීම පමණක් සිදු කර තිබුණි.
iv	මුදල් රෙගුලාසි 110	කලා භවනේ චිත්‍ර අස්ථානගත වීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.
v	මුදල් රෙගුලාසි 128(1)(ඉ)	රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල්, බඩු බාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් විධිවිධාන යොදනු ලබන බවට හා ඒවා වරින් වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත් ගණන් දීමේ නිලධාරී විසින් වගකිව යුතු වුවද, ජාතික කලා භවනේ චිත්‍ර සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2023 නොවැම්බර් 07 දිනැති අංක 03/2023 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 01 වන ඡේදය	අත්තිකාරම් 'බී' ගිණුමට අදාළ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර පවතින රු.31,094 ක වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

3.5 නැන්පතු

නැන්පතු ගිණුම් දෙකකට අදාළව වර්ෂ දෙක ඉක්මවූ එකතුව රු.12,252,366 ක් වූ නැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මෙහි, කාර්ය සාධන දර්ශක වලට අනුව අපේක්ෂිත නිමවුම් සංඛ්‍යාත්මක අගයක් ලෙස නිශ්චිතව දක්වා නොතිබුණි.

(ආ) අනුබද්ධ ආයතන මගින් වැඩසටහන් පැවැත්වීම් සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී, එක් එක් අනුබද්ධ ආයතනය මගින් පැවැත්වීමට නියමිත වැඩසටහන් කුමක්ද යන්න නිශ්චිතව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) 2020 වර්ෂයේ සිට නවීකරණ කටයුතු ආරම්භ කර තිබුණු ජාතික කලා භවන හා 2013 වර්ෂයේ එම කටයුතු ආරම්භ කළ ජෝන්ද සිල්වා සමරු රඟහල සඳහා පිලිවෙලින් රු. මිලියන 120 හා රු. මිලියන 500 ක ප්‍රතිපාදන ප්‍රවර්තන වර්ෂය සඳහා වෙන් කර ගෙන තිබුණද, වර්ෂය තුළ එම ප්‍රතිපාදන ප්‍රශස්ත අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රතිපාදන ඉතිරි වීම පිළිවෙලින් සියයට 79 හා 100 අගයක් ගෙන තිබුණි.

(ආ) රාජ්‍ය ළමා නාට්‍ය උළෙල, වැඩමුළු හා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා රු. මිලියන 8.5 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද, වර්ෂය තුළදී එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඇ) පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා රු. මිලියන 1.3 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද, වර්ෂය තුළ එම කටයුතු ප්‍රමාණාත්මක පරිදි සිදුකර නොතිබුණු අතර සියයට 90 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතන සංවර්ධනය කිරීමට අනුග්‍රහය ලබා දීම හා ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳුණු කලාංග ප්‍රවර්ධනය උදෙසා කලායතන දිරිගැන්වීම සඳහා ආධාර ලබා දීමේ අරමුණින් කලා ආයතන සඳහා ආධාර ලබා දීම (වැය විෂය 206-2-3-3-1508) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද, කලායතන සම්බන්ධයෙන් යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොමැති බවත්, ආධාර ලබා දීමේ ක්‍රමය අසාර්ථක බවට කලායතනාධිපතිවරුන්, සංස්කෘතික නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරු හා දිස්ත්‍රික් ලේකම්වරු ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇති බවත් ලිපිගොනු පරීක්ෂා කිරීමේදී නහවුරු විය. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ අරමුණුගතභාවය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) වාර්ෂිකව කලා ආයතන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර ඒ මත පදනම්ව ආධාර ලබාදිය යුතු බවට ප්‍රමාණාත්මක හේතු සහිත කලායතන හඳුනාගෙන එම කලායතන සඳහා පමණක් ආධාර ලබා දීමට කටයුතු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 2022 හා 2023 වර්ෂ සඳහා සිදුකරන ලද සමීක්ෂණයක් මත පදනම්ව කලායතන 1,268 ක් සඳහා රු.7,848 බැගින් රු.9,951,264 ක මුදලක් ප්‍රවර්තන වර්ෂය තුළදී ආධාර ලෙස ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) අනුබද්ධ ආයතන මගින් වර්ෂය සැවැත්විය යුතු වැඩසටහන් නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව රුපියල් මිලියනයක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබූ අතර වර්ෂය තුළ රු.මිලියන 0.29 ක ප්‍රතිපාදන පමණක් භාවිතා කරමින් අනුබද්ධ ආයතන දෙකක් විසින් පමණක් වැඩසටහන් පවත්වා තිබුණි. මේ හේතුවෙන් රු.මිලියන 0.71 ක ප්‍රතිපාදන නිශ්කාර්යයව පැවතුණි.

(ඈ) මිල කළ නොහැකි උරුමයන් ප්‍රවර්ධනය හා සංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (206-2-3-12-1409) යටතේ අස්පර්ශනීය උරුම පර්යේෂණ, ප්‍රවර්ධන හා සංචර්ධන වැඩසටහන් සිදු කිරීම සඳහා රු. මිලියන 5 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද, එම වැඩසටහන් නිශ්චිතව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණ අතර 2025 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය දැක්වීමේ වාර්තාව අනුව වැඩසටහන් 7 ක් සඳහා රු. මිලියන 1.51 ක ප්‍රතිපාදන වැය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ සිදු කල යුතු වැඩසටහන් නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව ප්‍රතිපාදන වෙන්කර ගැනීම මත රු. මිලියන 3.49 ක ප්‍රතිපාදන නිශ්කාර්යයව පැවතුණි.

4.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

විශ්වකෝෂ සම්පාදනය කිරීම 1956 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර, අවසන් වරට විශ්වකෝෂයේ 14 වන කාණ්ඩය 2019 වර්ෂයේදී සම්පාදනය කර තිබුණි. 2024 හා 2025 වර්ෂවලට අදාළව නිකුත් කරන ලද ක්‍රියාකාරී සැලැසුම් අනුව වර්තමානය වන විට විශ්වකෝෂයේ ඉදිරි කාණ්ඩයන් සම්පාදනය කිරීමේ කටයුතු නවත්වා ඇති අතර නිකුත් කරන ලද විශ්වකෝෂ කාණ්ඩයන් අන්තර්ජාලගත කිරීම පමණක් සිදුකර තිබුණි. ඒ අනුව රාජ්‍ය අනුග්‍රහය යටතේ සිංහල භාෂාවෙන් සම්පාදනය කරනු ලබන එකම විශ්වකෝෂය මෙය වන බැවින් මෙම විශ්වකෝෂ සම්පාදනය කාර්යය අඛණ්ඩව සිදුකරගෙන යාම පිළිබඳව සුදුසු ප්‍රතිපත්තිමය තීරණයක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ගත යුතු වුවද, එසර කිහිපයක සිට මෙම කාර්යය පිළිබඳව දෙපාර්තමේන්තුව අවධානය යොමුකර නොතිබීම මත 2025 ජූලි 29 දින වන විට විශ්වකෝෂ සම්පාදන කාර්යය සම්පූර්ණයෙන්ම නතරවී තිබුණි.

4.1.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද වාර්ෂික කාර්යසාධන වාර්තාව සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

කාර්යසාධන දර්ශක හා එහි අපේක්ෂිත ඉලක්ක ප්‍රමාණය ක්‍රියාකාරී සැලැස්ම මඟින් ස්ථාපිත කර නොතිබූ බැවින් කාර්යසාධන වාර්තා කෙටුම්පතේ දක්වා තිබුණු කාර්යසාධන දර්ශක 4ක් හා එහි ළඟාකරගැනීම් ප්‍රතිශතය ලෙස දක්වා තිබුණු අගයන්වල නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකිවිය.

4.2 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද එක් විගණන විමසුමක් සඳහා නියමිත දිනට පිළිතුරු ලබා දී නොතිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

(අ) ජාතික කලා භවන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පවරන ලද දිනයේ සිට මේ දක්වා ජාතික කලා භවනේ චිත්‍ර එකතුව පිළිබඳ නොරතුරු විධිමත්ව පවත්වා ගත යුතුව තිබුණද, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් කලා භවන රජයට පවරා දීමේදී ඒ සමඟ පවරන ලද චිත්‍ර සංඛ්‍යාව සහ පසුකාලීනව අලුතින් චිත්‍ර එකතු කිරීම්, චිත්‍ර ඉවත් කිරීම් සිදු කර ඇත්ද යන්න සහ 2008 වර්ෂයේදී සකස් කර ඇති චිත්‍ර නාමාවලියට හා 2016 වර්ෂයේදී සකස් කරන ලද තොග පොතට ඇතුලත් කර ඇති චිත්‍ර සංඛ්‍යාව නිවැරදිද යන්න තහවුරු කර ගැනීමට පාදක කර ගත හැකි කිසිදු මූලාශ්‍රයක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(ආ) වර්තමානය වන විට කලා භවනේ ඇති චිත්‍ර වර්ෂ 7කට ආසන්න කාලයක් අඛණ්ඩව වායු සමනය කර ඇති කාමරයක මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීමකින් තොරව ගබඩා කර තිබීම හේතුවෙන් මෙම චිත්‍ර නැරඹීමට පැමිණෙන්නන් හා අධ්‍යයන කටයුතු සඳහා මෙම චිත්‍ර පිළිබඳ නොරතුරු ලබා ගැනීමට අදහස් කරන්නන් විශාල බොහෝ පිරිසක් අපහසුතාවයට හා අසාධාරණයට පත්ව තිබුණි.

(ඇ) කලා භවනේ දැනට තිබෙන චිත්‍ර එකතුවේ පෞරාණික, ජාතික හෝ මූල්‍යමය වටිනාකම් කිසිදු අවස්ථාවක තක්සේරු කර නොතිබූ අතර සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂක විසින් 2024 ජූනි

14 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති අමතා කලා භවනේ ඇති චිත්‍ර වල වටිනාකම් පිළිබඳව තක්සේරුවක් කිරීමට ඉල්ලීමක් සිදු කර තිබුණද එවැන්නක් සිදු වූ බවට ලිපි ගොනු අනුව තහවුරු නොවිය.

(ඇ) 2015 වර්ෂයේ සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් පසු චිත්‍ර 42 ක උණතාවයක් ඇති බවට එම වාර්තාවෙන් තොරතුරු ඉදිරිපත් කළ පසු එම තොග පොත ආරක්ෂිතව තබා ගැනීමට කටයුතු කල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 2015 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයට පාදක කරගත් 1987 වර්ෂයේ සිට පවත්වාගෙන ආ තොග පොත අස්ථාන ගත වී තිබුණි.

(ඉ) 2016 වර්ෂයේ සකස් කරන ලද චිත්‍ර නාමාවලියේ චිත්‍ර 239 ක් තිබුණු අතර 2008 වර්ෂයේ සකස් කරන ලද චිත්‍ර නාමවලියේ චිත්‍ර 247 ක් ඇතුළත්ව තිබුණි. තවද, 2008 වර්ෂයේ සකස් කළ නාමාවලියේ නොතිබුණු චිත්‍ර 6 ක්ද 2016 නාමාවලියේ ඇත. ඒ අනුව 2016 වර්ෂය වන විට 2008 වර්ෂයේ තිබූ චිත්‍ර 14 ක් අස්ථානගතව ඇත. ඒ අනුව කලා භවනේ චිත්‍ර සංඛ්‍යාව වෙනස් වීම පිළිබඳව පූර්ව වසර 17 කට ආසන්න කාලයක තොරතුරු හඳුනාගත හැකි කිසිදු මූලාශ්‍රයක් නොමැති වීම පිළිබඳව එහි කළමණාකාරීත්වය සහ චිත්‍ර භාරව සිටින නිලධාරීන් වගකිව යුතු වුවද, එම චිත්‍රවල භාරකාරීත්වය දැරූ නිලධාරීන් සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය කර සංවර්ධනය කිරීමේ අදියර I ට අදාළ කොන්ත්‍රාත්කරු විසින් වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව එනම් 2018 නොවැම්බර් 24 දින ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැඟිල්ල භාර දී තිබුණ ද, ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද රු.38,658,734 ක මූදල් නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු නහවුරු කර ගැනීමකින් තොරව නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර එම මූදල් නැවත ගෙවන ලෙස 2021 මැයි 10 දින කොන්ත්‍රාත්කරුට දැනුම් දී තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වාම එම මූදල් අය කර ගෙන නොතිබුණි.

(උ) 2024 මැයි 29 දිනැති අංක 01/2024 හා 2025 ජනවාරි 24 දිනැති අංක 01/2024(I) රාජ්‍ය මූදල් චක්‍රලේඛ විධිවිධාන අනුව දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අතහැර දැමීමට අවශ්‍ය පියවර ගැනීමට ගණන්දීමේ නිලධාරියා කටයුතු කල යුතු වුවද, ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 22 දෙනෙකුගෙන් අයවිය යුතු රු.78,878 ක්වූ එකතු ණය ශේෂයක්ද, මියගිය නිලධාරීන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.23,931 ක්වූ එකතු ණය ශේෂයක්ද, වැඩ නහනම් කළ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.48,070 ක්වූ එකතු ණය ශේෂයක්ද, සේවය හැරගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.96,672 ක්වූ එකතු ණය ශේෂයක්ද, හඳුනානොගත් හා තාවකාලික වැටුප් ලැබූ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය විය යුතු රු.23,923

ක්‌වූ එකතු ණය ශේෂයක්‌ද වශයෙන් එකතුව රු.271,474 ක්‌ වූ ණය ශේෂයක්‌ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

(අ) ජාතික විගණන පනතේ 38 (ඊ) වගන්තිය අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක්‌ ඇති බවට සහතික වීම ගණන් දීමේ නිලධාරියෙකුගේ වගකීමක්‌ වේ. ඒ අනුව අභ්‍යන්තර විගණකවරයකු පත්කර නිසි පරිදි අභ්‍යන්තර විගණනය සිදු කිරීමට අවශ්‍ය පහසුකම් හා පරිසරය ගණන් දීමේ නිලධාරී විසින් ඇති කළ යුතු වේ. එසේ වුවද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර 2011 ජූලි 28 දින සිට අනුමතව පැවතියද, ප්‍රවර්තන වර්ෂයේදී ද අභ්‍යන්තර විගණකවරයෙකු සහ ප්‍රමාණවත් විගණන කාර්ය මණ්ඩලයක්‌ පත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) ජාතික විගණන පනතේ 40(2) වගන්තිය අනුව අමාත්‍යාංශයක්‌ යටතේ ඇති එක්‌ එක්‌ දෙපාර්තමේන්තුව සඳහා එහි ගණන් දීමේ නිලධාරියා විසින් එම දෙපාර්තමේන්තුවේ **අභ්‍යන්තර** විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයකු පත් කර නොමැති අවස්ථාවක 2018 අංක 19 දරන ජාතික විගණන පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසර දෙකක්‌ නොඉක්‌මවන කාලසීමාවක්‌ තුළ එම පත්කිරීම සිදු කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්‌ත කාර්ය මණ්ඩලය, තාවකාලික කාර්ය මණ්ඩලය

අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 18 ක ප්‍රතිශතයක්‌ පුරප්පාඩු වී තිබූ අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 28 කින් 14 ක්‌ ද, තෘතීයික මට්ටමේ තනතුරු 4 කින් 2 ක්‌ ද, ද්විතීක මට්ටමේ තනතුරු 613 කින් 51 ක්‌ ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 185 කින් 81 ක්‌ ද වශයෙන් තනතුරු 148 ක්‌ පුරප්පාඩු වී තිබුණි. ඒ අනුව ප්‍රතිශතයක්‌ වශයෙන් ගත් කළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා

තෘතීයික මට්ටමේ තනතුරු වලින් සියයට 50 බැගින් ද, ද්විතීක මට්ටමේ තනතුරු වලින් සියයට 8 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු වලින් සියයට 44 ක් ද, පුරප්පාඩු වී තිබීම හේතුවෙන් ආයතනය පවත්වාගෙන යාමේදී ගැටලුකාරී තත්වයන් ඇතිවිය හැක.

කේ.එච්.ජූ.ඩී.සරත්කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

ආයතනයේ කාර්යසාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
රාජ්‍ය සම්මාන උළෙල, ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා සිදු කරන සමස්ථ වියදම, ඒක පුද්ගල වියදම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව		√	
කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා සුභසාධන කටයුතු සිදු කිරීමේ දී දරන සමස්ථ වියදම, ඒක පුද්ගල වියදම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව	√		
දිස්ත්‍රික් සංස්කෘතික කටයුතු සඳහා සිදු කරන සමස්ථ වියදම, ඒක පුද්ගල වියදම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව	√		
අස්පර්ෂීය උරුම ව්‍යාප්තිකරණය හා ප්‍රවර්ධනය උදෙසා භෞතික සම්පත් සංවර්ධනය උදෙසා සිදුකරන සමස්ථ වියදම, ඒක පුද්ගල වියදම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව		√	

05.පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% – 74%	75% - 100%
නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	උරුමයේ ආකාරය අනුව සියලු සංස්කෘතික උරුමයන් රැකගැනීම, ආරක්ෂාව සහ සංරක්ෂණය වෙනුවෙන් සිදු කරන සමස්ත ඒක පුද්ගල වියදම එනම් රාජ්‍ය සම්මාන උළෙල, ව්‍යාපෘති හා වැඩසටහන් කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා සුභසාධන කටයුතු සිදු කිරීමේ දී දරන සමස්ථ වියදම, දිස්ත්‍රික් සංස්කෘතික කටයුතු හා අස්පර්ෂීය උරුම ව්‍යාප්තිකරණය හා ප්‍රවර්ධනය උදෙසා දරන වියදම			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

- රාජ්‍ය සම්මාන උළෙල, ව්‍යාපෘති හා වැඩසටහන් යටතේ, - 2025 වර්ෂය තුළ සම්මාන උළෙල 05 ක් පැවැත්වීම (රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙල, රාජ්‍ය නර්තන උලෙළ, රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ, රූපවාහිනී රාජ්‍ය සම්මාන උලෙළ) ද මෙහිදී ප්‍රශස්ත නිර්මාණකරුවන්ට වෙක් වෙක් කලා ක්ෂේත්‍රයන්හි සුවිශේෂ මෙහෙවරක් සිදුකළ කලාකරුවන්ට හා විද්වතුන්ට සුවිශේෂ ඇගයීමක් වූ අතර රාජ්‍ය සම්මානයට පාත්‍රවීම තුළ ඔවුන් අභිප්‍රේරණය වීම සිදුවිය. එමෙන්ම රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ නිර්මාණාදිය සුභාවිත නිර්මාණ වශයෙන් සමාජගත වීම සිදුවූ අතර මෙමගින් නවක නිර්මාණකරුවන්ට ස්වකීය නිර්මාණකරණයේදී ආදර්ශයක් ලබාගත හැකි නිර්මාණ සමුච්චයක් ජනගත වීම සිදුවිය.

- කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා සුභසාධන කටයුතු සිදු කිරීම යටතේ - කලාකරු හැදුනුම්පත් 743 ක් නිකුත් කිරීම, වෛද්‍ය ආධාර කලාකරුවන් 224 දෙනෙකු උදෙසා ලබාදීම, අගහිඟ කලාකරු ආධාර 2911 දෙදෙකු සඳහා ලබාදීම, කලායතන ආධාර 1268 ක් ලබාදීම, පෙරහැර ආධාර 22 ක් ලබාදීම, අවමංගල ආධාර 100 දෙනෙකු සඳහා ලබාදීම, විවිධ උත්සව ආධාර 8 ක් ලබාදීම, කලාකරු සුවදම් ජාතික මට්ටමේ 08 ක් හා ප්‍රාදේශීය මට්ටමේ 341 සිදුකිරීම, රාජ්‍ය සංගීත කණ්ඩායම විසින් ප්‍රසංග 35 ක් හා රාජ්‍ය නර්තන කණ්ඩායම විසින් ප්‍රසංග 48 ක් සිදු කිරීම සිදුවිය.

- දිස්ත්‍රික් සංස්කෘතික කටයුතු යටතේ- දොළොස්මහේ පහන වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශය මට්ටමින් සිදු කිරීම, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය වශයෙන් සාහිත්‍ය උත්සව සඳහා ප්‍රතිපාදන ලබාදීම රුපියල් 25,000 බැගින් ලබාදීම සිදුවූ අතර වෙක් වෙක් කාර්තුවට අදාළ ප්‍රතිපාදන ලබාදෙමින් දොළොස්මහේ පහන වැඩසටහන ක්‍රියාවට නැංවීය

- අස්පර්ෂීය උරුම ව්‍යාප්තිකරණය හා ප්‍රවර්ධනය උදෙසා භෞතික සම්පත් සංවර්ධනය යටතේ, ලෝක රූකඩ දින සැමරුම, - සුසැට කලා මංගල්‍ය ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව සිදු කිරීම සහ රාජ්‍ය පොසොන් හේවිසි පූජාව සිදුකිරීම මෙන්ම එය සංරක්ෂණය කිරීම ද සිදුවිය.

- අස්පර්ශනීය උරුම වැඩසටහන් යටතේ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබාදීමට වැඩි නැඹුරුවක් ගන්නා ලදී මේ අනුව ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය උරුම ලැයිස්තු සම්පාදනය මුලික කරගත් පුහුණු වැඩසටහන් දෙකක් සිදුකිරීමට හැකියාව ලැබිණ. ඒ අනුව වයඹ පළාත මුලික කරගත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සංස්කෘතික නිලධාරීන්ට යුනෙස්කෝ මාර්ගෝපදේශයන්ට අදාළ ඉන්වෙන්ට්‍රි සම්පාදනය සදහා වන පුහුණුව ලබාදීමටත් එය දෙමළ පළාත් මුලික කරගනිමින් සිදුකිරීමේ අවශ්‍යතාව සදහා උතුරු පළාතේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දෙමළ භාෂා වැඩසටහනක් ද සිදුකරන ලදී.

- අස්පර්ශනීය උරුමය පිළිබඳ කාර්යයන් තිරසාරව සිදුකිරීම සඳහා සැලැස්මක් සකස් කර ගැනීම අරමුණු කර ගනිමින් රාජ්‍ය අස්පර්ශනීය කලා උරුම සහ සාම්ප්‍රදායික කලා අනුමණ්ඩලයේ දායකත්වය යටතේ තුන් අවුරුදු සැලැස්මක් සකස් කිරීමට සිදුවිය.

- ළමා පරපුර කේන්ද්‍ර කරගත් වැඩසටහනක් වශයෙන් හා සංස්කෘතික මානවයෙකු ගොඩනැගීමේ මුලික පියවරක් වශයෙන් අතීතයේ පටන් පැවති ළමා කතන්දර කවි හා ළමා ගී ගායනා කලාව නැවත ජනගත කිරීම උදෙසා 'අතුරු මිතුරු' නමින් නව්‍ය වැඩසටහනක් සම්පාදනය කර ක්‍රියාත්මක කරන ලදී

අභියෝග

- සෑම වසරකම අග භාගයේ සිදුකරන කලාකරුවන් ඇගයීම හා නිර්මාණ ඇගයීම සඳහා කෙරෙන රාජ්‍ය සම්මාන උත්සව පැවැත්වීමේ අභියෝගයකට ලක් විය. වසර අවසාන භාගයේ සංවිධානය කර තිබූ රාජ්‍ය උත්සව ගණනාවක් දිට්වා කුණාටුව සහ එමගින් වූ ආපදා තත්ත්වය මත සිදු කිරීමට නොහැකි විය.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/අතිරික්ත
ජ්‍යේෂ්ඨ	28	14	14
තෘතීයික	04	02	02
ද්විතියික	612	562	50
ප්‍රාථමික	185	104	81

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසෙදැයි කෙටියෙන් සඳහන් කරන්න

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ඇතැම් තනතුරුවල හිඟයක් හෝ අතිරික්තයක් ඇත. (උදා- සංවර්ධන නිලධාරී සේවයේ ඇතැම් දිස්ත්‍රික්කවල අතිරික්තයක් පවතින අතර උතුරු හා නැගෙනහිර පළාත තුල හිඟයක් පවතී. මේ අතර කළමණාකරණ සේවයේ හිඟයක් පවතී) මෙම හිඟය හෝ අතිරික්තය කාර්යසාධනයට යම් බලපෑමක් සිදුකරන බව පෙනේ. ඒ සඳහා හිඟය හෝ අතිරික්තය තුළ අදාල කාර්යය ඉටුකිරීමට නිසි පුහුණුව ලද නිලධාරී නොමැතිවීම දැකිය හැකි ගැටලුවයි. මෙය පසුගිය වසරේ මෙන්ම 2025 වසරේද පැවති තත්ත්වයයි

මීට අමතරව පවත්නා තත්ත්වයට හා නූතන තාක්ෂණය සමග ක්‍රියාකරන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ හිඟයක් ඇති බව පෙනේ. උදාහරණයක් වශයෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ශබ්දවාහිනී ක්‍රියාකරවීම සඳහන් කළ හැකිය. එය සංගීත ප්‍රසංගයකට සුදුසු පරිදි ශබ්ද සංකලනය කිරීමේ දැනුම දැනට සිටින කාර්යමණ්ඩලය වෙත ලබාදිය යුතු තත්ත්වයක් දැකිය හැකිය. මේ ගැටලුව නිසා බැහැරින් සේවා සපයා ගැනීමට සිදුව ඇති බව පෙනේ. මේ ආකාරයෙන් නිසි පුහුණුවක් භාවිතා කරන භාණ්ඩ සහ උපකරණ නවීකරණය වීමත් සමග ලබාදීම වැදගත් කොට සැලකිය යුතුව ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය(දේශීය/විදේශීය	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශිය		
මුදල් රෙගුලාසි පුහුණුව	28	දින 01	14,349.00	නැත	දේශීය	මුදල් රෙගුලාසි පිළිබඳ නිලධාරීන් අවබෝධය ලබා ගැනීම
ආයතන සංග්‍රහය පුහුණුව	28	දින 01	9,579.00	නැත	දේශීය	ආයතන ක්‍රියා කිරීමේ නෛතික පසුබිම හා ක්‍රමවේද පිළිබඳ පුහුණුව
ආකල්ප සංවර්ධනය හා ධාරිතා පුහුණුව - දිස්ත්‍රික් පුහුණු වැඩසටහන - කෑගල්ල	20	දින 01	30,000.00	නැත	දේශීය	නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය හා ධාරිතා වර්ධනය

ඉදිරිපත් කිරීමේ කුසලතා සංවර්ධනය - දිස්ත්‍රික් පුහුණු වැඩසටහන - මාතලේ	17	දින 01	25,000.00	නැත	දේශීය	නිලධාරීන්ගේ ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය හා ඔපවත් වීම
නායකත්ව හා හැකියා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව - දිස්ත්‍රික් පුහුණු වැඩසටහන - මහනුවර සහ නුවරඑලිය	31	දින 01	35,000.00	නැත	දේශීය	නායකත්ව පුහුණුව හා ගුණාංග වර්ධනය වීම
ඉදිරිපත් කිරීමේ කුසලතා සංවර්ධනය - දිස්ත්‍රික් පුහුණු වැඩසටහන - බදුල්ල හා මොනරාගල	32	දින 01	35,000.00	නැත	දේශීය	නිලධාරීන්ගේ ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය හා ඔපවත් වීම
වාර්ෂික ගබඩා සමීක්ෂණය හා භාවිතා කල නොහැකි භාණ්ඩ අපහරණය	02	දින 01	28,000.00	නැත	දේශීය	වාර්ෂික ගබඩා සමීක්ෂණය හා භාවිතා කල නොහැකි භාණ්ඩ අපහරණය පිළිබඳ දැනුම
ප්‍රසම්පාදන සැලසුම්	04	දින 01	50,000.00	නැත	දේශීය	ප්‍රසම්පාදන සැලසුම් පිළිබඳ දැනුම හා අවබෝධය

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	-		
02	පොත්පත් හා ලේඛන නඩත්තුකිරීම (මු.රේ. 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රේ. 135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ හට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදීම	අනුකූල වේ		
3.4	2014.05.11 දැනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජ භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැකැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම			
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත	2026 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කෙරේ
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	විගණන විමසුම			

5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු දී තිබීම	අනුකූල වේ		
06	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ 134(2) /1-2019 ට අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත	2026 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කෙරේ
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත	2026 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කෙරේ
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාරතාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත	2026 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කෙරේ
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත	2026 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කෙරේ
07	විගණන හා කළමණාකරණ කමිටු			
7.1	ADM චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.			
08	වත්කම් කළමණාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

09	වාහන කළමණාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	අපහරණ කමිටු වාර්තාව ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල නොවේ	මෑත කාලයේ එවැනි අවස්ථාවලට මුහුණ දී නොමැත	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමණාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට වම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට වලඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් කර තිබීම	අනුකූල වේ		

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණයශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම්			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල්පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	මානව සම්පත් කළමණාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	ප්‍රධාන කාර්යාලය, අනුබද්ධ ආයතන වල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල බොහෝ තනතුරු වල පුරප්පාඩු මෙන්ම සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ පමණක් අතිරික්තද පවතී	විධිමත් පරිදි අදාල කාලයන් තුල විභාග පවත්වා බඳවාගැනීම් සිදු කිරීම
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා	අනුකූල වේ		

	දෙපාර්තමෙන්තුව වෙත ඉදිරිපත් කර තිබීම			
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සපයා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	මේ වනතෙක් එවැනි අවස්ථාවන් වලට අදාල ඉල්ලීම් ඉදිරිපත් වී නොමැති බැවින් ගැටළුවක් ඇතිවී නොමැත	
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසී/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	දැනට අවශ්‍ය සංශෝදන සිදු කෙරෙමින් පවතී	
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජියෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන	අනුකූල වේ		

	සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිවිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම			
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		